වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2020



දේශීය වෛද්‍ය විද්‍යායතනය

உண்ணாட்டு மருத்துவக் கல்வி நிறுவகம்

INSTITUTE OF INDIGENOUS MEDICINE

කොළඹ විශ්වවිද්‍යාලය

கொழும்புப் பல்கலைக்கழகம் இலங்கை

UNIVERSITY OF COLOMBO

දැක්ම

ආයුර්වේද, යුනානි සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම පිළිබඳ
ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත්
ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම
මධ්‍යස්ථානය බවට පත් වීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික
වෛද්‍ය ක්‍රමවල උන්නතිය සඳහා අවශ්‍ය දැනුම
බෙදා හැරීම සඳහා වන
ඉගැන්වීම් සහ පර්යේෂණ
සිදු කිරීම



අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය

2020 වර්ෂය තුළ අපේ ජයග්‍රහණ වාර්තා කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට ලැබීම ගැන මම සතුටු වෙමි. පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එය ඉතා තීරණාත්මක වසරක් විය. එබැවින්, සෞඛ්‍ය ආරක්ෂක මාර්ගෝපදේශවලට අනුකූලව අධ්‍යයන හා පරිපාලන කටයුතු දැඩි දුෂ්කරතා මධ්‍යයෙහි සිදු කරන ලදී. කෙසේ වෙතත්, සියලු දේශන සහ සමහර විභාග ඔන්ලයින් ක්‍රමයට මාරු කරනු ලැබූ නිසා සියලු මට්ටම්වල සිසුන් වසංගතය අතරතුර අක්‍රියව නොසිටි අතර විභාග සඳහා පැමිණ පෙනී සිටින ලෙස අවසන් වසර සිසුන්ගෙන් ඉල්ලන ලදි.

අධ්‍යයන / පරිපාලන / අනධ්‍යයන / ශිෂ්‍ය ව්‍යූහ හරහා අභ්‍යන්තර ක්‍රියාකාරකම් ඇගයීම සඳහා පවත්වන ලද BUMS සහ BAMS අධ්‍යයන වැඩසටහන්වල වැඩසටහන් සමාලෝචනය ආයතනය විසින් සාර්ථකව නිම කරන ලද අතර සියල්ල විශිෂ්ටත්වය ඇති කිරීම, අපගේ ඉගෙනුම් සහ පර්යේෂණ හැකියා වැඩිදියුණු කිරීම කෙරෙහි අරමුණු කොට තිබිණි. වැඩසටහන් සමාලෝචන ක්‍රියාවලිය හරහා, සමාලෝචන මණ්ඩල, IIM හි සංචාරය කොට දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෛද්‍යවරුන් බිහි කිරීම සඳහා විෂය මාලාවේ අධ්‍යාපනික ඵලදායීතාව, ඉගැන්වීමේ අරමුණු සඳහා කාර්ය මණ්ඩලය සහ IIM හි ලබා ගත හැකි යටිතල පහසුකම් පහසුකම් කාර්යක්ෂමව භාවිත කිරීම පරීක්ෂා කිරීම තුළින් BAMS සහ BUMS වැඩසටහන් ඇගයීමට ලක් කරන ලදි. එබැවින්, IIM හට එහි ශක්තීන්, අභියෝග, දුර්වලතා සහ ඉඩප්‍රස්තා හඳුනා ගත හැකි වූ අතර අධ්‍යයන වැඩසටහන්වල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචන මණ්ඩල මඟින් ලබා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.

කෙසේ වෙතත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අපට ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ බොහෝ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. ආයතනයේ කාර්ය සාධනය නැවත සක්‍රිය කර මෙරට දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රමුඛ ආයතනය බවට පත් වීමට ක්‍රියාකාරී සැලසුමේ සඳහන් වඩාත්ම වැදගත් ඉලක්ක සපුරා ගැනීමට ආයතනය උත්සාහ කළේය.

විද්‍යායතනය එහි දැක්ම අනුව අඛණ්ඩව ක්‍රියා කළ අතර ළඟා කර ගත් ජයග්‍රහණ ගැන සාඩම්බර වෙයි. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා මිශ්‍ර ඉගෙනුම පිළිබඳ පුහුණු වැඩමුළු ඇතුළුව ආයතනය වසර අවසානයේදී ඉලක්කගත ව්‍යාපෘති සාර්ථකව නිම කර තිබුණි. අපි දැන් ඉගැන්වීම ක්‍රම සඳහා මිශ්‍ර ඉගෙනුම ක්‍රියාත්මක කරන අතර මහත් උද්‍යෝගයකින් සහ සුබවාදී බවකින් අනාගතය දෙස බලා සිටිමු. ඉදිරි වසර තුළ අපගේ අවධානය යොමු වන්නේ විෂයමාලා සහ යටිතල පහසුකම් සංවර්ධනය හරහා හොඳම දේශීය වෛද්‍යවරුන් බිහි කිරීමට අපගේ නව උපාය මාර්ග මූලාරම්භ කිරීම පිළිබඳවය. නව විෂයමාලාව හඳුන්වා දීම සහ තිබෙන විෂයමාලාව සංවර්ධනය කිරීම සඳහා 2020 වසර පුරා විෂයමාලා සංවර්ධන කමිටුවට (CDC) එහි අප්‍රතිහත උත්සාහය පිළිබඳ මම මාගේ ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමි. මම පසුගිය වසරේ අපගේ සම්ප්‍රදායන් සහ සුවිශේෂී ජයග්‍රහණ ශක්තිමත් කිරීමට සහ අපගේ කැපවීමෙන් යුත් කාර්ය මණ්ඩලයට සහ කුසලතා පූර්ණ සිසුන්ට සිය හැකියාවෙහි උපරිමය කරා ළඟා වීමට සුරැකුම සහ සහාය අඛණ්ඩව ලබා දීමට අපේක්ෂා කරමි.

2020 වසර තුළදී සිදු කළ වැඩවල ප්‍රගතිය පහත දී තිබේ.

2020-2024 සඳහා උපායමාර්ගික සැලසුම සංවර්ධනය කිරීම විශාල ජයග්‍රහණයක් වූයේ එහි ආයතනයේ ඉලක්ක අර්ථ නිරූපණය කොට නිශ්චිත වැඩ සැලසුම්වලට ප්‍රමුඛතා හඳුනා ගැනීමට උදව් වන බැවිනි. උපායමාර්ගික සැලසුමේ අරමුණුවලට දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනයට ඇති ඉල්ලුම වැඩි කිරීම, අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මය වැඩි කිරීම, පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම, සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි IIM හි දායකත්වය, ජාත්‍යන්තර ආයතන සමග අන්තර්ක්‍රියාකාරිත්වය වැඩි කිරීම, IIM හි භෞතික සහ සෞන්දර්යාත්මක පරිසරය සහ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම, මූල්‍ය කළමනාකරණය සහ තිරසාර භාවය සහතික කිරීම සහ IIM හි ගුණාත්මය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම ඇතුළත්ය. 2020 වසර සඳහා ක්‍රියාකාරී සැලසුම පිළියෙළ කරන ලද අතර කාර්ය සටහන් කරන ලද සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න සහතික කර ගැනීමට ක්‍රියාකාරී සැලසුමෙහි කාර්තුමය ඇගයීම් සිදු කරන ලදී.

තවද, නවක සිසුන් සඳහා නවක වදය අවම කිරීමට IIM අවශ්‍ය පියවර ගෙන ඇති අතර සියලු සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට හිතකර ඉගැන්වීමේ සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ඇත.

2020 ක්‍රියාකාරී සැලසුමේ විශේෂ සිදුවීම් අතර පහත දේවල් වේ.

විද්‍යායතනය දෙපාර්තමේන්තු හයක් (ආයුර්වේදය සඳහා දෙපාර්තමේන්තු 4ක් සහ යුනානි සඳහා දෙපාර්තමේන්තු 2ක්) සහිත දේශීය වෛද්‍ය විද්‍යා පීඨයක් ආරම්භ කිරීම සඳහා යෝජනා ලිවීම මූලාරම්භ කර ඇත. තවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි වෛද්‍ය සිසුන් සඳහා සකස් කරන ලද නව විෂය නිර්දේශයක් 2017/2018 බදවා ගැනීමෙහි සිසුන් සඳහා හඳුන්වා දෙන ලදී. BAM සහ BUMS උපාධි වැඩසටහන්වල තත්ත්වය පවත්වා ගැනීමට තිබෙන විෂය නිර්දේශයද සංශෝධනය කරන ලදී. IIM හි ප්‍රධාන සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනැගිලි යෝජනා දෙකක් (එකක් මහල් 8ක ගොඩනැගිල්ලක් ඉදි කිරීම සහ දෙවැන්න නව පිරිමි නේවාසිකාගාරයක් සඳහා) නිසි මාර්ගය ඔස්සේ භාණ්ඩාගාරයට යොමු කරන ලදී. විද්‍යායතනයෙහි පවතින ඉඩකඩ අවභිරතා වළක්වා ගැනීමට අපි මෙය ප්‍රමුඛතාවක් ලෙස සලකමු.

තවද, ආයුර්වේද සම්බාහන චිකිත්සාව සහ ඖෂධීය ඖෂධ නිෂ්පාදනය පිළිබඳ කෙටිකාලීන පාඨමාලා ආරම්භ කර ඇති බව සඳහන් කිරීමට මා කැමතියි. ආයුර්වේදය පිළිබඳ නව සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දුන් අතර එය 2021 දී ක්‍රියාත්මක කෙරේ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා පහක් සකස් කරන ලද අතර දැන් කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයෙන් අනුමැතිය ලබා ගැනීමට උත්සාහ කරමින් ඇත.

අපට තවම දිගු දුරක් ගමන් කිරීමට තිබෙන අතර, මෙම වාර්තාව විද්‍යායතනය යහපත් ප්‍රගතියක් ලබා ගන්නා බව ප්‍රදර්ශනය කරන බව මම අපේක්ෂා කරමි. මම සියල්ලටම පළමුව විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට මගේ නායකත්වය කෙරෙහි ඉතා හොඳින් ප්‍රතිචාර දැක්වීම, ඔවුන් විසින්ම මූලාරම්භයන් රැසක් සිදු කිරීම සහ ඉලක්ක සහ නියමිත කාලය තුළ කටයුතු ඉටු කිරීම සපුරා ගැනීම පිළිබඳ ස්තුතිය පළ කිරීමට කැමතියි. මම විශේෂයෙන්ම ආයුර්වේද සහ යුනානි අංශවල හිටපු සහ වර්තමාන ප්‍රධානීන්ට ඔවුන් විද්‍යායතනයට සහ මට ලබා දුන් දැඩි සහයෝගය වෙනුවෙන් ස්තුතිය පළ කරමි. නියෝජ්‍ය ලේඛකාධිකාරි, නියෝජ්‍ය මූල්‍යාධිකාරි සහ සියලු පරිපාලන කාර්ය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පිරිනමමි. IIM හි සුවිශේෂී ප්‍රගතිය ළඟා කර ගැනීම සඳහා සියලු අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය ඉතා වටිනේය.

අවසාන වශයෙන්, උසස් බලධාරීන්ගේ මග පෙන්වීම මත, කොළඹ විශ්වවිද්‍යාලය යටතේ දේශීය වෛද්‍ය පීඨයක් වශයෙන් දේශීය වෛද්‍ය විද්‍යායතනය වෙනස් කිරීමට සියලු පියවර ගෙන ඇති බව සඳහන් කිරීමට මම කැමතියි.

අපගේ සාර්ථකත්වය යනු දේශීය වෛද්‍ය ක්‍රමයේ සාර්ථකත්වයයි. අපගේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන්ගේ අඛණ්ඩ සහාය සමගින්, විද්‍යායතනය ඉදිරි 2021 වසර තුළ අභියෝග සහ ජයග්‍රහණ සඳහා සූදානම්ය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඒ. පරණගම
අධ්‍යක්ෂ /IIM

අන්තර්ගතය | පිටු අංකය

01. ආයතනයේ අධිකාරීන්

1:0	දේශීය වෛද්‍ය විද්‍යායතනය පිළිබඳ හැඳින්වීම	01-04
1:1	ආඥාපනත	05
1.2	කළමනාකරණ මණ්ඩලය	06-07
1.3	අධ්‍යක්ෂක	08
1.4	අධ්‍යයන කමිටු	08
1.4.1	ආයුර්වේද අංශීය කමිටුව	08
1.4.2	යුනානි අංශීය කමිටුව	09

02. අධ්‍යයන අංශ, ඒකක සහ මධ්‍යස්ථාන **09**

2.1	අධ්‍යයනාංශ යටතේ ඒකක/ ආයුර්වේද	09
2.2	අධ්‍යයනාංශ යටතේ ඒකක/ යුනානි	09
2.3	තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි ඒකකය	10
2.4	පුස්තකාලය	10
2.5	පරිපාලන අංශ	11

03. දේශීය වෛද්‍ය විද්‍යායතනය පිළිබඳ දළ විශ්ලේෂණයක් **11**

3.1	රැස්වීම් සහ කමිටු	11
3.2	පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු	12
3.3	කාර්ය මණ්ඩල වෙනස් වීම් 2019	12
3.4	කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන	13
3.5	පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	13
3.6	ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර – 2020	14
3.7	ධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	15
3.8	කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධන පුහුණුව – 2020	15
3.9	විශේෂ ක්‍රියාකාරකම්	16-18
3.10	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන	19
3.11	ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වලදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය	19
3.8	පුනරුත්ථාපන සහ ඉදි කිරීම් - 2020	20

04. ශිෂ්‍ය පැතිකඩ **20**

4.1	BAMS සහ BUMS උපාධි වැඩසටහන් පිළිබඳ විස්තර	20
4.2	ආයුර්වේද සහ යුනානි උපාධි වැඩසටහන්වල ඉලක්ක සහ අරමුණු	21
4.3	උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම (31.12.2020 දිනට)	22
4.4	ශිෂ්‍ය සුබසාධනය	23
4.4.1	මූල්‍ය සහාය	23-24
4.4.2	ශිෂ්‍ය නේවාසිකාගාර	25
4.5	ආයතනයේ ශිෂ්‍ය සංගම්	26
4.6	ආයුර්වේද ශික්ෂණ රෝහල	26

05. මූල්‍ය සහ ගිණුම්කරණ විස්තර **27-28**
06. ප්‍රගති වාර්තාව 2020 QA කවය **28-29**
07. නිරසාර සංවර්ධනය **30-35**
08. මූල්‍ය ප්‍රකාශන **35-73**
09. විගණකාධිපතිවරයාගේ වාර්තාව සහ පිළිතුරු **74-85**

හැඳින්වීම

දහනවවන ශතවර්ෂය අවසානයේ දී, එවකට සිලෝන් ලෙස හැඳින් වූ, බ්‍රිතාන්‍ය යටත් විජිතයට, දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබූ නමුත්, දේශීය වෛද්‍ය අධ්‍යාපනය සැපයීමට විද්‍යාලයක් නොවීය. ඇති කරන ලද ආයතන හෝ සංවිධාන තුනක් විසින් සාම්ප්‍රදායික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීම සහ පෙරදිග වෛද්‍ය ක්‍රමය භාවිතා කරන වෘත්තිකයින්ගේ වෘත්තීය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී. මෙම සංගම් වූයේ "සිංහල වෛද්‍ය සංගමය (1891), ශ්‍රී ලංකා වෛද්‍ය මහ මණ්ඩලය (1901), සහ ශ්‍රී ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය (1915) ය. ශ්‍රීමත් සොලමන්, ආර්. ඩයස් බණ්ඩාරනායක, එෆ්.ආර්. සේනානායක, කේ. බාලසිංහම්, ඩොනල්ඩ් උභයසේකර සහ ආනන්ද කුමාරස්වාමි යනාදී සම්මානිත පුද්ගලයන් මේ සඳහා අරමුදල් සම්පාදනය කිරීමෙහි යෙදුණ දේශමාමකයන්ය.

වර්ෂ 1926 දී, පළමු වතාවට, දේශීය වෛද්‍ය ක්‍රමය ගැන සොයා බැලූ කමිටුවක්, මෙම වෛද්‍ය ක්‍රමය පිළිබඳ උනන්දුවක් දක්වන අය සඳහා පුහුණුවක් ලබා දීමට යාබද ශික්ෂණ රෝහලක් සහිත විද්‍යාලයක් පිහිටු විය යුතු බව යෝජනා කළේය. 1928 දී එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් 'ආයුර්වේද සම්මේලන සභාව' නමින් උපදේශක සභාවක් ආචාර්ය කේ. බාලසිංහම් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරන ලදී. මෙම කමිටුවේ නිර්දේශ මත පදනම්ව, "ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය" (දේශීය වෛද්‍ය විද්‍යාලය) යනුවෙන් නම් කරන ලද ආයතනයක් 1929 ජුනි 10වන දින ස්ථාපනය කරන ලද අතර එය එවකට ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා වූ, ජෙනරාල් ශ්‍රීමත් හර්බට් ජේම්ස් ස්ටැන්ලි විසින් බොරැල්ල, කොටා පාරේ පිහිටි බවර් ගොඩනැගිල්ලේදී සමාරම්භ කරන ලදී. ඉන්දියාවෙන් පැමිණි ආචාර්ය ඒ. එන්. එන්. පනික්කාර් මහතාට බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳ සුදුසුකම් සහ ආයුර්වේද විද්‍යා පිළිබඳ මනා පුහුණුවක් තිබූ අතර ඔහුව එම අලුතින් පිහිටුවන ලද විද්‍යාලයෙහි පළමු විදුහල්පති ලෙස එවක රජය විසින් පත් කරන ලදී. ඒ හා සමානව, වෛද්‍ය එච්. එම්. ජාෆර් සහ වෛද්‍ය එච්. අහමඩ් යන ඉන්දියානුවන්ද යුනානි වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට කැඳවන ලදී.

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ තවත් වැදගත් සංධිස්ථානයක් වන්නේ 1941 අංක 17 දරණ දේශීය වෛද්‍ය ආඥාපනත ක්‍රියාත්මක කිරීමයි. ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. සෞඛ්‍ය අමාත්‍යවරයා සහ දේශීය වෛද්‍ය උපදේශක සභාවේ සභාපතිවරයා වශයෙන් ජාතික ප්‍රමිතියක් සහිතව විද්‍යාලයේ ඉගැන්වීමෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නීති සම්පාදනය කර ඇත. වර්ෂ 1961 දී, 1941 අංක 17 දරණ දේශීය වෛද්‍ය ආඥාපනත අහෝසි කර 1961 අංක 31 දරන ආයුර්වේද පනත සම්පාදනය කරන ලද අතර විද්‍යාලය රජයේ දේශීය වෛද්‍ය විද්‍යාලය ලෙස යළි නම් කර ආයුර්වේද විද්‍යාල හා රෝහල් මණ්ඩල පාලනය යටතට ගෙන එන ලදී. මෙය ආයුර්වේද සෞඛ්‍ය සේවා සැපයුම සහ ආයුර්වේද, යුනානි හා සිද්ධ යන වෛද්‍ය ක්‍රමවල අධ්‍යාපනයෙහි ගුණත්වය වැඩි කිරීම සඳහා ගන්නා ලද පියවරකි. නම් වශයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද විද්‍යාලය සහ රෝහල් මණ්ඩලය, ආයුර්වේද පර්යේෂණ කමිටුව සහ ආයුර්වේද ඖෂධ සම්පාදන කමිටුව යන ආයතන හතරක් පිහිටුවන ලදී.

දේශීය වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය ඩිප්ලෝමා (DIMS) පාඨමාලාව, 1963 දී නව ආයුර්වේද පනත යටතේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය ඩිප්ලෝමාව (DAMS) යනුවෙන් නම වෙනස් කරන ලදී.

1977 දී, දේශීය වෛද්‍ය විද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යායතනය ලෙස අන්තර්ග්‍රහණය කළ අතර, 1972 අංක 1 විශ්වවිද්‍යාල පනත යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී. 1977 මාර්තු මස 30 දිනැති අංක 258 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1977 අංක 1 දරන ආයුර්වේද ආයතන පනත ප්‍රකාරව මෙය සිදු කරන ලදී. මෙම පියවරේ අරමුණ වූයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රමවල සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයන් බිහි කිරීමයි. 1979.12.21 දිනැති අංක 67/14 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන ආඥා පනත කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ

ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය ඇතිව විෂයමාලාවට බොහෝ වෙනස්කම් සිදු කර ඇත. එවැනි විශාල සංශෝධනයක් වූයේ 1982 දී ආයුර්වේදය, සිද්ධ සහ යුනානි හි විවිධ අංශවල විශේෂඥයින්ගේ සහාය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආයුර්වේදය පිළිබඳ උපදේශක මහාචාර්ය පී.එන්.වී. කුරුප්පු විසින් ලබා ගැනීමය.

1977 දී ආයතනය ස්ථාපිත කිරීමත් සමඟ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍යය (BAMS) සහ යුනානි වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යය (BUMS) යන උපාධි පාඨමාලා දෙකක් ආයතනයේ අංශ දෙකකින් ආරම්භ කරන ලද අතර 1983 දී පළමු කණ්ඩායම උපාධි ලබා ගන්නා ලදී. මෙම උපාධි 1992.10.26 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනමන ලදී.

ආරම්භයේ සිටම, බොරැල්ලේ පිහිටි ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල ප්‍රායෝගික දැනුම සහ නිපුණතා ලබා දීම සඳහා වූ සම්පත් ලබා දීමේ මධ්‍යස්ථානය වශයෙන්, විශේෂයෙන්ම සායනික සැකසීමක් තුළ කටයුතු කර ඇත. ආයතනය සතුව ඉගැන්වීමේ වගකීම් දරණ පශ්චාත් උපාධි සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින අතර අධ්‍යයන වර්ෂ පහ තුළදී විවිධ විෂයයන් 23ක් දැන් ඉගැන්වේ. විෂය මාලාව තුළ නිපුණ දේශීය වෛද්‍ය උපාධිධාරියෙකු බිහි කිරීම සඳහා ආයුර්වේදය/ යුනානි සහ වෙනත් අදාළ විද්‍යා පිළිබඳ අධ්‍යයන ද්‍රව්‍ය අඩංගු වේ. සෑම අධ්‍යයන වර්ෂයක්ම සති තිහක (30) ඉගැන්වීමක් සහිත වාර තුනකින්, මධ්‍ය වාර නිවාඩු දෙකක් සහිතව සමන්විතය. එක් එක් අධ්‍යයන වර්ෂය අවසානයේදී, වාර්ෂික පරීක්ෂණ පැවැත්වේ. සෑම විභාගයක්ම ලිඛිත, viva-voce සහ ප්‍රායෝගික / සායනික අංගයන්ගෙන් සමන්විත වේ.

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ (IIM) අධ්‍යයනාංශ දෙකක් තිබේ

1.ආයුර්වේද අධ්‍යයනාංශය

ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි මුල්ම යොමුව මහා වෛද්‍යවරයෙකු සමඟ සම්බන්ධ වී තිබේ; එනම් ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන ශ්‍රී ලංකාවේ රාවණා රජුය. සාම්ප්‍රදායිකව, රාමායනයෙහි රාවණා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ හසල දැනුමක් ඇති අයකු බව විශ්වාස කෙරේ. ඔහුගේ යුගයේදී ඉන්දියාවේ හිමාලය පෙදෙස පදනම් වූ වෛද්‍ය සමුළුවකදී ඔහු ශ්‍රී ලංකාව නියෝජනය කළ බව රාමායනය සඳහන් කරයි. මෙම කාලයේදී ශ්‍රී ලංකාවෙහි යක්ෂ, රාක්ෂ, නාග සහ වැද්දන් යන ගෝත්‍ර හතරක් විය. ශ්‍රී ලංකාවේ ඉතිහාස විද්‍යාව අනුව රාවණා රජු ආයුර්වේදය පිළිබඳ පහත සඳහන් වෛද්‍ය කෘතිවල කතුවරයා විය. ආර්කප්‍රාක්ෂය, නාඩි විඥානය, කුමාරතන්ත්‍රය සහ උඩ්ශාතන්ත්‍රය.

ශ්‍රී ලංකාව ආවේණික ඖෂධීය ශාක වර්ග රාශියකින් පොහොසත් රටකි. ශාකවලින් බහුතරයක් ඉන්දියාවේ භාවිතා කළ ආකාරයටම භාවිත වේ. දොළුකන්ද සහ රූමස්සල යනු රාම රජුගේ පුරාවෘත්තයෙහි සඳහන් වානර රජු හනුමාන් ශ්‍රී ලංකාවට ගෙන එන ලද හිමාලයෙහි කොටසක් බව විශ්වාස කෙරේ. ප්‍රාග් ඓතිහාසික සොහොන් බිම්වලින් සොයා ගන්නා ලද සාක්ෂි අනුරාධපුරය, පොළොන්නරුව, මැදිරිගිරිය සහ පොම්පරිප්පු හරහා ආයුර්වේදයෙහි පෞරාණික භාවිතා ගැන සඳහන් කරයි.

මිහින්තලේ, මැදිරිගිරිය සහ පොළොන්නරුවේ ආලාහණ පිරිවෙණ ආදී පැරණි සංඝාවාසවල ඇති අවශේෂ ව්‍යුහ පුරාණ රෝහල්වල දැනට හඳුනාගෙන ඇති ව්‍යුහ කොටස් බවට හෙළි වී ඇත. එම රෝහල්වල අනන්‍යතාව සෙල් ලිපි සහ ඖෂධ සහ වෙනත් උපකරණ සොයා ගැනීමත් සමඟ තහවුරු කර තිබේ. මහාවංශය සහ චූලවංශය තුළ සඳහන් වන පරිදි පැරණි රජවරුන් බොහෝ දෙනා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සංවර්ධනය සඳහා ඔවුන්ගේ සේවය කැප කර ඇත. එවැනි ක්‍රියා සඳහා උදාහරණ ලෙස පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 4වන සියවස), සේන රජු (ක්‍රි.ව. 851-885), බුද්ධදාස රජු (ක්‍රි.ව. 362-409), ධාතුසේන රජු (ක්‍රි.ව. 460-478) දැක්වේ. රටෙහි දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ තේජවත් ඉතිහාසයක් උරුම වී තිබූ බව එවැනි පැරණි ආයුර්වේද සාක්ෂිවලින් දැක් වේ. නමුත් 16වන ශතවර්ෂයේ අග භාගයේ දී විදේශීය ආක්‍රමණ හේතුවෙන් එය පසුගාමී බවට පත් විය. ඉන් පසුව ආයුර්වේදය ස්වාධීන ක්‍රියාවලියක් තුළ තනිවම වැඩි දියුණු විය. සාම්ප්‍රදායික ක්‍රියාවලියක් ලෙස එය භාවිතයට ගන්නා ලදී. (මාපිය උරුමය) උදා: ඇස් වෙදකම (අක්ෂි වෛද්‍ය විද්‍යාව) ගෙඩිවණ (ගෙඩි සහ වණ සඳහා ප්‍රතිකාර), සර්පවිෂ (විෂවේදය), පිස්සුබලු (ජලභීතිකාව), විදුම්පිළිස්සුම් (පිළිස්සුම්), කැඩුම් බිඳුම් (අස්ථි බිඳීම හා විස්ථාපනය).

වර්තමානයේදී ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 16,800 ක් පමණ ලියාපදිංචි වී ඇති අතර එයින් 5000 කට වැඩි පිරිසක් අධ්‍යාපනික හා ආයතනික වශයෙන් රටට සහ ජාතියට සේවය කිරීමට සුදුසුකම් ලබා තිබේ.

2.යුනානි අධ්‍යයනාංශය

යුනානි වෛද්‍ය විද්‍යාවේ ඉතිහාසය ඇරඹෙන්නේ පෙරිකල්ස් යුගය (ක්‍රි.පූ. 562-430) සමඟ වන අතර අරාබි ශිෂ්ඨාචාරය අතරතුර එය වර්ධනය විය. එබැවින්, එය අරාබි වෛද්‍ය විද්‍යාව ලෙස ද හැඳින්වේ. මධ්‍යකාලීන යුගයේ දී නාවිකයින් වූ අරාබිවරුන්ට, ප්‍රධාන වශයෙන්ම ඉන්දියාව සමඟ වාණිජ සම්බන්ධකම් තිබුණද, පසුව ඔවුන් ශ්‍රී ලංකාව සමග සෘජු වෙළඳාමක් පැවැත්වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම වෙරළබඩ ප්‍රදේශවල පදිංචි වූහ.

21වන ශතවර්ෂයේ දී පවා ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මෙම ක්‍රමය ව්‍යාප්ත කර සංරක්ෂණය කර තබා ගත්තේය. එහි ප්‍රමුඛයා වූයේ බොහාරත් (හිපොක්‍රටීස් ක්‍රි.පූ. 460-360) නම් අයකු වන අතර ඔහු තවමත් ''වෛද්‍ය විද්‍යාවේ පියා'' ලෙස සැලකෙන අතර, තිදෝෂ වාදයෙහි බලධරයා ඔහු විය. ශ්‍රේෂ්ඨ දාර්ශනික අරාස්තු (ඇරිස්ටෝටල් ක්‍රි.පූ. 384-322) යුනානි වෛද්‍ය විද්‍යාවේ ඊළඟ ප්‍රමුඛ පුද්ගලයා විය. ජාලිනූස් (ගැලෙන් ක්‍රි.පූ. 131-210) අරාබිවරුන්ට ව්‍යවච්ඡේදක දැනුම හඳුන්වා දුන්නේය.

එතැන් සිට යුනානි පද්ධතිය සංවර්ධනය සඳහා දායක වූ බොහෝ බලධාරීන් විය. ඉබන් සිනා (අවිසෙන්නා 937-1037) යුනානි වෛද්‍ය ක්‍රමයේ වඩාත්ම ජනප්‍රිය වෛද්‍යවරයා සහ දාර්ශනිකයා විය. වෛද්‍ය විද්‍යාවට ඔහු දැක්වූ දායකත්වය අතර විශ්වකෝෂයක් සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පෙළ පොතක් වන “Canon of Medicine” වේ. පළමුවන සියවසේදී අරාබිවරුන් මෙම ක්‍රමය ශ්‍රී ලංකාවට ගෙන ආ අතර මුස්ලිම්වරුන්ද එය වැඩිදියුණු කළහ. ඉතිහාසය හෙළිදරව් කරන්නේ අරාබි කායික වෛද්‍යවරුන් රටේ විවිධ රාජධානිවල රජුන්ගේ පවුලේ උපදේශකයන් බවට පත්ව සිටි බවය. යුනානි වෛද්‍ය ක්‍රමයෙහි ඵලදායී බව සහ වටිනාකම හඳුනා ගෙන, සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයට එය එක්ව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය ලෙස ආයුර්වේදය අන්තර්ග්‍රහණය විය. ශ්‍රී ලංකාවේ සියලු සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම 1961 ආයුර්වේද පනත මගින් එක් ස්ථානයකට ගෙන ඇත. ඒ අනුව "ආයුර්වේද" යන්නට ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ ආසියානු රටවලට දේශීය වූ අනෙකුත් සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුළත් වේ.

පසුව සිදු වූ විදේශීය ආක්‍රමණ හා සටන්වල ප්‍රතිඵලයක් ලෙස රාජාණ්ඩුවේ බලය බිඳ වැටුණු අතර, සියවස් ගණනාවකට පෙර රාජකීය අනුග්‍රහය ලද ආයුර්වේදය වෙනත් පුරාතන කලා ශිල්ප සමඟ පිරිහීමට පත් විය. ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සංවිධිත පුහුණුව නැවත ආරම්භ කරන ලද්දේ මෙම සියවස ආරම්භයේදීය.

ආයුර්වේදය ඇතුළු දේශීය කලා සහ විද්‍යා පුනර්ජීවනය කිරීමේ අරමුණින් ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය පිහිටුවන ලදි. අරමුදල් නොමැතිකම නිසා අවහිර වූ සංගමයේ ඉහළ ප්‍රමුඛතාවයක් වූයේ ආයුර්වේදය පුනර්ජීවනයයි. යටත් විජිත ආණ්ඩුවේ අනුග්‍රහය නොමැතිව, එහි අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලික දායකත්වය මත රඳා පැවතීමට එයට සිදු විය. රු. 131,000ක් වූ දායක මුදල් පොරොන්දු විය. මෙම මුදල් තැන්පත් කරන ලද්දේ පෙරදිග වෛද්‍ය විද්‍යා අරමුදල යටතේය. එය පෝල් එච්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුතු භාරකාර මණ්ඩලයක් මගින් පාලනය කරනු ලැබීය. 1916 දී, රෝහලක් පිහිටුවීමේ අදහස භාරකරුවන්ට ඇති විය.

1917 දී භාරකාර මණ්ඩලය විසින් ජී. පී. වික්‍රමාරච්චි සහ ආර්. බුද්ධදාස යන අයව කල්කටාවේදි පුහුණුව ලැබීමට තෝරා ගන්නා ලදි. ඔවුන්ගේ තේරීම අනාගතය හෙළිදරව් කරන්නක් (ආයුර්වේදය සංවර්ධනය) වූ අතර පසුව එම වෘත්තිය සඳහා ඔවුන්ගේ දායකත්වය කැපී පෙනෙන්නක් විය. පණ්ඩිත් වික්‍රමාරච්චි 1929 දී, තමාගේම විද්‍යාලයක් පිහිටුවන ලදී.

භාරකාර මණ්ඩලය 1929 දක්වා ශිෂ්‍යයන් දිගටම ඉන්දියාවට යැවීමට කටයුතු කළේය. වර්ෂ 1929 දී දේශීය වෛද්‍ය විද්‍යාලය ස්ථාපිත කිරීමේදී, ආචාර්ය කේ. බාලසිංහම් සහ ශ්‍රීමත් රසික් ෆරීඩ්ගේ අප්‍රතිහත වෙහෙස හේතුවෙන් යුනානි වෛද්‍ය ක්‍රමයද ආයුර්වේද සහ සිද්ධ වෛද්‍ය ක්‍රම සමගින් ස්ථාපනය කරන ලදී. ආචාර්ය එම්.ඒ. අහමඩ් සහ ආචාර්ය එච්. එම්. ජැෆර් යන අයට ඉන්දියාවේ යුනානි කථිකාචාර්යවරුන් ලෙස ආරාධනා කරන ලදී. ඔවුන් විද්‍යාලයේ යුනානි අංශය සංවිධානය කිරීම හා ස්ථාපනය කිරීම සඳහා වඩාත්ම දායක වූවන්ය. ආචාර්ය එච්. එම්. ජැෆර් එවකට දේශීය වෛද්‍ය විද්‍යා මණ්ඩලයේ සාමාජිකයෙකු වූ ශ්‍රීමත් රසික් ෆරීඩ් සමග එක්ව විද්‍යාලයේ යුනානි අංශය පවත්වා ගෙන යාමට ගත් වෑයම සඳහන් කළ යුතුය. යුනානි අංශයේ ප්‍රධාන කථිකාචාර්යවරයා ආචාර්ය එච්. එම්. ජැෆර් මහතා විය. ආචාර්ය එම්. එච්. එම්. හෆීල්, ආචාර්ය එම්. ඒ. එම්. ජලල්ඩීන් සහ ආචාර්ය එම්. අයි. විලියම් යන අය යුනානි අංශයේ ප්‍රධානීන් ලෙස තනතුරු දැරූහ. මෙම කාලය තුළ යුනානි අංශය සංවර්ධනය කිරීමට ඔවුන් සියලු දෙනා දැඩි වෙහෙසක් දැරූහ.

ආයතනයේ සංවිධාන ව්‍යුහය



01. ආයතනයේ අධිකාරීන්:

1.1 ආඥාපනත

දේශීය වෛද්‍ය විද්‍යායතනය 1979 අංක 07 දරන ආඥා පනත යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කර ඇත.

1.2 කළමනාකරන මණ්ඩලය

(අ) නිල බලයෙන් සාමාජිකයින්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ. පරණගම

අධ්‍යක්ෂ (සභාපති)

වෛද්‍ය කේ.සී. පෙරේරා (24.08.2020 දක්වා)
වෛද්‍ය එස්.පී. මොල්ලිගොඩ (17.09.2020 සිට)
අංශාධිපති/ ආයුර්වේද

වෛද්‍ය බී.එම්. නජීබ් (27.04.2020 දක්වා)
මහාචාර්ය එම්.එස්.එම්. ෂිෆා (26.05.2020 සිට)
අංශාධිපති/ යුනානි

කේ.ආර්. උඩුවාවල මයා (24.08.2020 දක්වා)
ජී.සී.එස්. තිලකරත්න මයා (28.09.2020 සිට)
අතිරේක ලේකම් / නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

වී. සෙනෙවිරත්න මයා (26.05.2020 දක්වා)
එච්.ඩබ්.එම්. පුෂ්පලතා මැණිකේ මිය (22.06.2020 සිට)
අතිරේක ලේකම්/ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය විද්‍යා අමාත්‍යාංශය

ඒ.එම්.ආර්.එන්. රාජපක්ෂ මයා (03.02.2020 සිට)
ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ

කේ.ඩී.එස්. කුමාරතුංග මහතා

කොමසාරිස්/ ආයුර්වේද

ආචාර්ය ස්වර්ණා කළුතොටගේ

අධ්‍යක්ෂ/ බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය

ආචාර්ය ආර්.එම්.කේ.බී. රත්නායක (03.02.2020 දක්වා)

ආචාර්ය එස්. සංඝමිත්තා (24.02.2020 සිට)

අධ්‍යක්ෂ/ ආයුර්වේද ශික්ෂණ රෝහල

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා (24.02.2020 දක්වා)

මහාචාර්ය ඩබ්. දිසානායක (26.05.2020 සිට)

පීඨාධිපති/ වෛද්‍ය පීඨය

මහාචාර්ය එම්.සී. වීරසිංහ

ආචාර්ය කේ. සිරිදේව

ආචාර්ය එස්. සෙනෙවිරත්න

වෛද්‍ය පීඨ සාමාජිකයින්

වෛද්‍ය එස්. එම්. එච්. සේනබණ්ඩා මහතා (26.05.2020 දක්වා)

වෛද්‍ය එම්.එච්.එන්. කරුණාසිරි (22.06.2020 සිට)

ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික

එස්. එස්. බී. ඩී. පී. සොයිසා මයා

එම්. ඩී. ඩී. පිරිස් මයා

මහාචාර්ය කපිල සෙනෙවිරත්න

ආචාර්ය ඩී. සේනසේකර

ආචාර්ය බී. එම්. රිෂාඩ්

ආචාර්ය එම්. ඩී. ජේ. අබේගුණවර්ධන

ආචාර්ය එච්. ධර්මවිජය

මහාචාර්ය එච්.ඒ.එස්. ආරියවංශ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ සාමාජිකයින්

එම්.එල්. වර්ණසූරිය මහතා (AAL)

(නියෝජ්‍ය ලේඛකාධිකාරී)

ලේකම්

1.3 අධ්‍යක්ෂ -ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ පරණගම

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ. පරණගම 2021 පෙබරවාරි 10 වන දින සිය දෙවන වාරය සඳහා රාජකාරී භාර ගත්තාය. ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙහි රසායන විද්‍යා අධ්‍යයනාංශයෙහි රසායන විද්‍යාව පිළිබඳ ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු විය. කුළු බඩු, සුගන්ධ තෙල් සහ දේශීය ඖෂධවලට අගය එකතු කිරීම පිළිබඳ පර්යේෂණ සඳහා සම්බන්ධ වූ ඇය ස්වාභාවික නිෂ්පාදන රසායනඥයෙකි. ඇය ලංකා රසායන විද්‍යා ආයතනයෙහි සභාපතිනියයි. ලංකා රසායන විද්‍යා ආයතනයෙහි අධි සාමාජිකයෙකු වන ඇය රසායන විද්‍යාව පිළිබඳ රාජකීය සංගමයෙහි වරලත් රසායනඥයෙකි (CChem). ඇය පොදුරාජ්‍ය මණ්ඩලීය රසායන විද්‍යා විධායක කමිටු සාමාජිකාවක් ලෙස ද කටයුතු කරයි. ඇය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටුවේ සභාපතිනිය වන අතර ආයුර්වේද වෛද්‍ය සභාවේ උප සභාපතිනියද වේ.

ඇය 1986 වසරේදී කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳව ගෞරව උපාධියක් සමගින් සිය උපාධිය ලබා ගත්තාය. ඇය 1990 වසරේදී පරිවාස කථිකාචාර්යවරියක වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයට එක් වූ අතර, 1991 දී කාබනික රසායන විද්‍යාව පිළිබඳ ඇයගේ දර්ශනශූරී උපාධිය ලබා ගැනීමට කර්මාන්ත සහ තාක්ෂණික ආයතනයට ඇතුළු වූවාය. ඇය 1994 වසරේදී එක්සත් රාජධානියේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයෙන් සිය ආචාර්ය උපාධිය, පෙව කාබනික රසායන විද්‍යා ක්ෂේත්‍රයෙන් ලබා ගත්තාය. ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ඇය ස්වාභාවික නිෂ්පාදන රසායන විද්‍යාව පිළිබඳ ස්වාධීන පර්යේෂණ වැඩ ආරම්භ කළාය. 2003 වසරේදී මහාචාර්යවරියක ලෙසද පසුව 2011 වසරේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියක ලෙසද උසස්වීම් ලැබූ ඇය, 2012 දී රසායන විද්‍යාව පිළිබඳ මූලාසනයට පත් වූවාය ඇය 2016 ජූනි සිට 2017 ඔක්තෝබර් දක්වා ලංකා රසායන විද්‍යා ආයතනයෙහි රසායන විද්‍යා විද්‍යාලයෙහි පීඨාධිපති ලෙස සේවය කළාය 2009 සිට 2012 වසර දක්වා ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙහි අංශ ප්‍රධානී ලෙස සේවය කළාය. ඇය 2019/2020 වසරේ ලංකා රසායන විද්‍යා ආයතනයෙහි සභාපතිනියයි. ලංකා රසායන විද්‍යා ආයතනයෙහි අධි සාමාජිකයෙකු වන ඇය රසායන විද්‍යාව පිළිබඳ රාජකීය සංගමයෙහි වරලත් රසායනඥයෙකි (CChem). ඇය ලංකාවේ වෘත්තිය ආයතන කිහිපයකම සාමාජිකයෙකි. ඇයට ලෝක විද්‍යා සංගමය (TWAS) මගින් සංවිධානය කළ විද්‍යාව තුළ වෘත්තීන් හැඩගැස්වීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි වීම සඳහා ඇරයුම් කරන ලද අතර, එම සම්මන්ත්‍රණය TWAS ප්‍රදාන ලබන ලොව ප්‍රමුඛ රසායනඥයන් විසින් සංවිධානය කරන ලදී. ඇය ජාතික සහ ජාත්‍යන්තර ප්‍රදාන සහ සම්මාන ගණනාවක් ලබා ගෙන ඇත. තවද ඇයට 2015 වසරේදී රසායන විද්‍යා පිළිබඳ කැපී පෙනෙන පර්යේෂණ සඳහා වන ආචාර්ය සී. එල්. ද සිල්වා රන් පදක්කම සහ 2018 වසරේදී ඇයගේ පර්යේෂණ වෘත්තියේ ජයග්‍රහණ වෙනුවෙන් මහාචාර්ය එම්. යූ. එස්. සුල්තාන්බාවා රන් පදක්කම ප්‍රදානය කරන ලදී. ඇය සුවිගත කල ජර්නල්වල පර්යේෂණ පත්‍රිකා 54කට වඩා පළ කර ඇති අතර පොත් / පොත් පරිච්ඡේද 11ක් ලියා හෝ සංස්කරණය කොට සංදේශ 120කට වඩා ප්‍රකාශයට පත් කර ඇත. ඇය ස්වාභාවික නිෂ්පාදන ඒකලනය සිට විශේෂාංගීකරණය, කුළු බඩු සහ සුගන්ධ තෙල් විශ්ලේෂණය, ස්වාභාවික නිෂ්පාදනවලට අගය එක් කිරීම සහ අංශුමය ලෝහවල විෂ වීම දක්වා පරාසයක රසායන විද්‍යාවේ විවිධ ක්ෂේත්‍ර ගණනාවක පශ්චාත් උපාධි සිසුන් 21කට වඩා වැඩි ගණනක් සාර්ථකව අධීක්ෂණය කර තිබෙන අතර දැනට පශ්චාත් උපාධි සිසුන් හතර දෙනෙකු අධීක්ෂණය කරමින් සිටී. ඇයගේ පර්යේෂණ රුචිකත්ව වන්නේ ශාක සහ එන්ඩොලිචනික දිලීරවල පෙව සක්‍රිය ස්වාභාවික නිෂ්පාදනවල ඒකලනය සහ විශේෂාංගීකරණය, පෙව වල්නාශක සංවර්ධනය සහ ස්වාභාවික නිෂ්පාදනවල අගය එක් කිරීමය. අවසාන වශයෙන්, ඇය ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක වැඩසටහන් සමාලෝචනවලට සහභාගී වීමේ අත්දැකීම ලබා ඇත.

1.4 අධ්‍යයන කමිටු

1.4 (1) ආයුර්වේද අංශීය කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද අංශයේ අදාළ සියලු අංශවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම ආයුර්වේද අංශීය කමිටුව වෙත පවරා ඇත.

1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන නියමාවලියේ 15(1) ඡේදය ප්‍රකාරව පහත පරිදි අධ්‍යයන කමිටුව 2013 පත් කොට ඇත.

ආයුර්වේද අංශීය කමිටුවේ සභාපති - ප්‍රධානී/ආයුර්වේද අධ්‍යයනාංශය
ආචාර්ය කේ. සී. පෙරේරා 01.01.2020 සිට 16.09.2020 දක්වා.

ආයුර්වේද අංශීය කමිටුවේ සභාපති - ප්‍රධානී/ආයුර්වේද අධ්‍යයනාංශය
ආචාර්ය එස්. පී. මොල්ලිගොඩ 17.09.2020 සිට 31.12.2020 දක්වා.

සියලු ස්ථිර කථිකාචාර්යවරුන් ආයුර්වේද අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

1.4 (2) යුනානි අංශීය කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ යුනානි අංශයේ අදාළ සියලු අංශවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම යුනානි අංශීය කමිටුව වෙත පවරා ඇත.

1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන නියමාවලියේ 15(1) ඡේදයට අනුකූලව පහත පරිදි 2019 වර්ෂයේදී අංශීය කමිටුව පත් කොට ඇත.

යුනානි අංශීය කමිටුවේ සභාපති:

මහාචාර්ය එම්. එස්. එම්. ෂිෆා, ප්‍රධානී/ අධ්‍යයනාංශය (යුනානි)

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ සියලු ස්ථිර කථිකාචාර්යවරුන් සහ යුනානි උපාධිධාරීන් වන බාහිර සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත යුනානි අංශීය කමිටුව, යුනානි අධ්‍යයනාංශයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

02. අධ්‍යයන, අංශ සහ ඒකක

2.1 අධ්‍යයනාංශය - ආයුර්වේද යටතේ ඇති ඒකක

ආයුර්වේද අධ්‍යයනාංශය නම් වශයෙන් ඒකක අටකින් (08) සමන්විත වේ,

I. මෞලික සිද්ධාන්ත
II. ද්‍රව්‍ය ගුණ විඥාන
III. ස්වස්තවෘත්ත
IV. කාය චිකිත්සා
V. දේශීය චිකිත්සා
VI. ප්‍රසූතන්ත්‍ර කෞමාරභෘත්‍ය
VII. ශල්‍ය ශාලක්‍ය
VIII. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන දෙඅංශයටම පොදුය)

2.2 යුනානි අධ්‍යයනාංශය යටතේ ඇති ඒකක

යුනානි අධ්‍යයනාංශය නම් වශයෙන් ඒකක අටකින් (08) සමන්විත වේ,

I. කුල්ලියත්
II. ඉල්මුල් අද්වියා
III. මෞලිජාත්
IV. නිස්වාන්වා කබාලත්
V. ඉල්මුල් ජරහත්
VI. හිෆ්සාන් සෙහාත්/ටහාෆුසි වා සමාජී ටිබ්
VII. දේශීය ඉලාජ්
VIII. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන දෙඅංශයටම පොදුය)

2.3 තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි ඒකකය

තොරතුරු තාක්ෂණ හා භාෂා විද්‍යාගාරය 2014 වසරේ මාර්තු මස HETC ව්‍යාපෘතිය යටතේ පිහිටුවන ලදී. ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පන්ති සඳහා පරිගණක 39ක් සහ අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක 16ක් සපයා ඇත.

2.4 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ පුස්තකාලය 1929 වසරේ දී ආයුර්වේද විද්‍යාලය ඇති කිරීමත් සමඟ පිහිටුවන ලදී. ආයතනයේ අධ්‍යාපනික හා පර්යේෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත් ලබා දෙමින් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වේ. ග්‍රන්ථ එකතුව සඳහා මූලික වශයෙන් ආයුර්වේද හා යුනානි වෛද්‍ය ක්ෂේත්‍ර ඇතුළත් වේ. ප්‍රවර්තන වාර සඟරා එකතුවට මුද්‍රිත අනුවාදයේ දායකත්වය ලබා ඇති සඟරා 21ක් ඇතුළත් වේ.

පුස්තකාල කාර්ය මණ්ඩලයේ විස්තර - 2020

තනතුර	සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (ශ්‍රේණිය I)	01
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති (ශ්‍රේණිය II)	01
මාණ්ඩලික සහකාර	02
පුස්තකාල සහ තොරතුරු සහායක (ශ්‍රේණිය II)	01
පුස්තකාල සහ තොරතුරු සහායක (ශ්‍රේණිය III)	02
පුස්තකාල සහායක (ශ්‍රේණිය I)	01
පොත් බැඳුම්කරු (ශ්‍රේණිය II)	01
වැඩ සහායක (ශ්‍රේණිය II)	01

මිලට ගැනීම් සහ - පුස්තකාලය සඳහා රුපියල් 106,860.00ක් වටිනා පොත් සහ වාර සඟරා

රුපියල් 1,327,886.81ක් වටිනා වාර සඟරා මිලදී ගන්නා ලදී.

ප්‍රදාන - පොත් 10ක් ප්‍රදාන ලෙස ලැබී ඇත.

තාක්ෂණික සේවා - 2020 වසර තුළදී බැහැර ගෙන යාමේ පොත් 3,770ක් සහ විමර්ශන පොත් 403ක් නිකුත් කර ඇත.

- පුස්කොළ පොත් එකතුවේ අක්ෂර කළු වර්ණ ගැන්වීම

විශේෂ සේවා - බැහැර දීමේ සේවාව, විමර්ශන සේවාව, ලේඛන බෙදා හැරීමේ සේවාව (ශිෂ්‍ය සහාය සේවාව) වත්මන් දැනුවත් කිරීමේ සේවාව, අන්තර් පුස්තකාල ණය සේවාව, ඡායා පිටපත් සේවාව, අන්තර්ජාල පහසුකම්

පරිශීලකයන් සංඛ්‍යාව - උපාධි අපේක්ෂක සිසුන්- ආයුර්වේද - 934

- යුනානි - 265

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 88
අනධ්‍යයන කාර්ය මණ්ඩලය - 122
ප්‍රදර්ශකයින් - 33

2.5 පරිපාලන අංශ

පහත සඳහන් පරිදි පරිපාලන අංශ හතක් ඇත.

1. අධ්‍යක්ෂක කාර්යාලය
2. නියෝජ්‍ය ලේඛකාධිකාරි කාර්යාලය
3. නියෝජ්‍ය මූල්‍යාධිකාරි කාර්යාලය
4. මූල්‍ය අංශය
5. ශිෂ්‍ය ලියාපදිංචි සහ සුබසාධන අංශය
6. විභාග අංශය
7. ආයතන අංශය
8. සාමාන්‍ය පරිපාලනය සහ ප්‍රාග්ධන වැඩ අංශය

ආයතනයේ විභාග අංශය සහ සාමාන්‍ය පරිපාලන සහ ප්‍රාග්ධන වැඩ අංශය නියෝජ්‍ය ලේඛකාධිකාරි යටතේ කටයුතු කරයි. සහකාර ලේඛකාධිකාරි ආයතන අංශය භාරව කටයුතු කරයි. සහකාර ලේඛකාධිකාරි ශිෂ්‍ය කටයුතු, ශිෂ්‍ය කටයුතු භාරව සිටී. නියෝජ්‍ය මූල්‍යාධිකාරි විද්‍යායතනයේ මූල්‍ය පාලනය භාරව කටයුතු කරන අතර එක් ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරයකු වැටුප් හා ගෙවීම් භාරව සිටින අතර අනෙක් ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි සැපයුම් භාරව සිටී.

03. දේශීය වෛද්‍ය විද්‍යායතනය පිළිබඳ දළ විශ්ලේෂණයක්

3.1 රැස්වීම් සහ කමිටු

	රැස්වීම්වල නම්	වසර තුළ පැවැත්වූ රැස්වීම් ගණන
(i)	කළමනාකරණ මණ්ඩලය	11
(ii)	මූල්‍ය කමිටුව	04
(iii)	විභාග උප කමිටුව	04
(iv)	සැලසුම් සහ ගොඩනැගිලි කමිටුව	06
(v)	අධ්‍යයන ඒකක රැස්වීම්	09
(vi)	අධ්‍යයනාංශ කමිටුව/ ආයුර්වේද	21
(vii)	අධ්‍යයනාංශ කමිටුව/ යුනානි	20
(viii)	විගණන සහ කළමනාකරණ කමිටුව	04
(ix)	පරිපාලන ප්‍රධානිගේ රැස්වීම	05

3.2 පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු:

<u>සේවක වර්ගීකරණය</u>

සේවා ප්‍රවර්ගය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව
ප්‍රාථමික මට්ටම			
1. ප්‍රාථමික ශ්‍රේණිය- නුපුහුණු	PL- 1	46	23
2. ප්‍රාථමික ශ්‍රේණිය- අර්ධ පුහුණු	PL- 2	13	12
3. ප්‍රාථමික ශ්‍රේණිය- පුහුණු	PL- 3	14	10
ද්විතියික මට්ටම			
1. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන	U- MN 1	66	37
2. කළමනාකරණ සහකාර- තාක්ෂණික	U-MT 1	14	5
3. සහාය නිලධාරි- 2 ඛණ්ඩය	U-MN 2		1
4. සහාය නිලධාරි- 1 ඛණ්ඩය	U-MN 3		4
5. මාණ්ඩලික සහකාර/ අධි සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4		12
තෘතියික මට්ටම			
1. අධ්‍යයන සහාය- 2 ඛණ්ඩය	U-AS 1	1	0
2. කනිෂ්ඨ විධායක/ කළමනාකරුවන්	U-EX 1	2	2
3. අධ්‍යයන සහාය- 1 ඛණ්ඩය	U-AS 2	5	4
ජ්‍යෙෂ්ඨ මට්ටම			
1. වෛද්‍ය නිලධාරි	U-MO 1	-	-
2. ප්‍රධාන වෛද්‍ය නිලධාරි	U-MO 2	-	-
3. මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX 2	4	4
4. මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX 2 (a)	2	
5. ජ්‍යෙෂ්ඨ විධායකයින්	U-EX 3	-	
6. කථිකාචාර්ය	U-AC 3	94	70
7. සහාය මහාචාර්ය	U-AC 4		
8. මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5		7

මුළු පත්වීම්:

`	අධ්‍යයන	-	0
	පරිපාලන	-	0
	අනධ්‍යයන	-	0
	අධ්‍යයන සහායක	-	0

3.3 2020 කාර්ය මණ්ඩලය වෙනස් වීම්:

කාර්යය	අධ්‍යයන	පරිපාලන	අනධ්‍යයන	අධ්‍යයන සහාය
පත්වීම්	-	-	-	-
ස්ථිර කිරීම්	3	-	11	01
උසස් කිරීම්	10	-	05	-
මාරු කිරීම්	-	3	-	-
සේවය දිගු කිරීම්	3	-	-	-
විශ්‍රාම ගැනීම්	1	-	04	-

- **31.12.2020** දිනට සේවක සංඛ්‍යාව

සේවක සංඛ්‍යාව	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	87	78	09
අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	06	03	02
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	153	101	52
පරිපාලන කාර්ය මණ්ඩලය	07	07	-

3.4 කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන - 2020:

(i)	ස්ථිර අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	-	81
(ii)	ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩලය	-	07
(iii)	ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය	-	101

කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන - 2020:



3.5 පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර - 2020

තනතුර	අනුමත සංඛ්‍යාව	සංඛ්‍යාව
නියෝජ්‍ය ලේඛකාධිකාරි	01	01
නියෝජ්‍ය මූල්‍යාධිකාරි/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි	02	03
සහකාර මූල්‍යාධිකාරි	01	00
සහකාර ලේඛකාධිකාරි	02	02
එකතුව	06	06

3.6 විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර - 2020

	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය ස්ථිර නොකළ	කථිකාචාර්ය (පරිවාස)	කථිකාචාර්ය
ආයුර්වේද	සිංහල/ ඉංග්‍රීසි	1	2	37	2	5	1
යුනානි	දෙමළ/ ඉංග්‍රීසි	-	4	17	-	3	4
එකතුව		1	4	56	2	8	5

විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර – 2020



3.7 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර – 2020

	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	කනිෂ්ට කාර්ය මණ්ඩලය	සුළු සේවක කාර්ය මණ්ඩලය
අධ්‍යක්ෂකගේ කාර්යාලය	1	1	1
පරිපාලන ශාඛාව	-	9	6
ආයතන ශාඛාව	1	2	1
විභාග ශාඛාව	2	1	2
ශිෂ්‍ය ලියාපදිංචි සහ සුබසාධන අංශය	-	5	1
මූල්‍ය අංශය	1	7	2
ආයුර්වේද අධ්‍යයනාංශය	1	7	15
යුනානි අධ්‍යයනාංශය	-	5	2
පුස්තකාලය	2	3	3
IT අංශය	-	-	2
වෛද්‍ය මධ්‍යස්ථානය	-	1	1
අධ්‍යයන සහ ප්‍රකාශන	-	3	1
නඩත්තු	-	-	12
එකතුව	8	44	49

මුළු සාමාජික සංඛ්‍යාව 98ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, කළමනාකාර සහකාර, තාක්ෂණික සහ තාක්ෂණික නොවන, පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු කාර්ය මණ්ඩලය ලෙස පරිපාලන අංශ, අධ්‍යයනාංශ, නඩත්තු සහ උද්‍යාන අංශ යටතේ සේවය කරයි. ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ.

3.8 කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධන පුහුණුව - 2020

අනධ්‍යයන කාර්ය මණ්ඩලය	ආයතනයෙන් බැහැර පුහුණුව	-
	වෘත්තීය පුහුණුව	-
සියලු කාර්ය මණ්ඩල ප්‍රවර්ග	ප්‍රසම්පාදන කළමනාකරණ වැඩමුළුව	-
	මූල්‍ය කළමනාකරණ වැඩමුළුව	-
	IT වැඩමුළුව	-
පරිපාලන කාර්ය මණ්ඩලය	වෘත්තීය පුහුණුව	-

3.9 විශේෂ ක්‍රියාකාරකම්

* IIM ක්‍රිකට් හමුව (18.01.2020)

* ආගමික කටයුතු (වාර්ෂික පිරිත් සජ්ජායනා වැඩසටහන)-2020.02.29)

* මැලේරියාව -BAMS සහ BUMS සඳහා වසංගත රෝග විද්‍යා දේශනය (2020.03.12)

* ජාතික සහ ජාත්‍යන්තර වෙබිනාර් (2020.06.28)

* දේශීය ඔෂධ පැළ සිටුවීමේ වැඩසටහන (17.09.2020)

IIM ක්‍රිකට් හමුව (18.01.2020)



**ආගමික ක්‍රියාකාරකම්
(වාර්ෂික පිරිත් සජ්ජායනා
වැඩසටහන-2020.02.29)**



මැලේරියාව -**BAMS** සහ **BUMS** සඳහා වසංගත රෝග විද්‍යා දේශනය **(2020.03.12)**



ජාතික සහ ජාත්‍යන්තර වෙබිනාර් **(2020.06.28)**



දේශීය ඖෂධ පැළ සිටුවීමේ වැඩසටහන **(17.09.2020)**



3.10 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

විෂය	ප්‍රකාශයට පත් කළ	ඉදිරිපත් කළ
උද්ධෘත ගණන	**05**	
පර්යේෂණ ගණන	**17**	**03**
ජර්නල ගණන	**17**	
පොත් ගණන	**04**	
ලිපි ගණන	**17**	**05**
එකතුව	**60**	**08**





3.11 ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වලදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය

01. කොවිඩ් -19 කළමනාකරණය සඳහා ආයුර්වේදය, යුනානි සහ **සාම්ප්‍රදායික** වෛද්‍ය විද්‍යාවේ ශක්තිය පිළිබඳ ජාත්‍යන්තර වෙබිනාරයක් ලේකම්වරයෙකු වශයෙන් සංවිධානය කළේය.

02.වැඩමුළු පැවැත්වීය ළමා බෝ නොවන රෝග සහ ඒවා කළමනාකරණය -NITM වෛද්‍ය නිලධාරීන් සහ CMO

03. IIM හි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ධාරිතා වර්ධන වැඩමුළු මාලාවක් පැවැත්වීය

03. පර්යේෂණ සොයා ගැනීම් - **සුදර්ශන පැණිය** ශ්‍රී ලාංකික නව නිපැයුම් කරුවන්ගේ විභව්‍ය නව නිපැයුම් හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ වසංගත කොවිඩ් -19 තත්වයට එරෙහිව සටන් කිරීම සඳහා ඔවුන්ගේ නව නිපැයුම් ප්‍රායෝගිකව භාවිතා කිරීමට පහසුකම් සලසයි.

04. නව මිශ්‍රණය **සුදර්ශන පැණිය** දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය සහ ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද කොවිඩ් -19 එරෙහි ජාතික කමිටුව විසින් කොවිඩ් -19 රෝගීන් සඳහා ප්‍රතිකාරයක් ලෙස භාවිතා කිරීමට අනුමැතිය දී ඇත.

05. ඩී.එම්.සී.ප්‍රභාත් ජයතිලක සහ **වෛද්‍ය ඕ.ටී.එම්.ආර්.කේ.එස්.බී. කළුවාන** විසින් දේශීය වෛද්‍ය සූත්‍රයක් භාවිතයෙන් ශාකසාර සිරප් සකස් කිරීම

06. සිය දරුවන් සමග පාකිස්තාන, ඇෆ්ගනිස්ථාන සහ යේමන කාන්තාවන් සඳහා ආයුර්වේද දිනචර්යා (දෛනික චර්යාව) සමඟ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීය.

07. මීගමුව අල් හිලාල් මධ්‍ය මහා විද්‍යාලයේ සියවස් සැමරුම වෙනුවෙන් යුනානි ප්‍රදර්ශන භාණ්ඩ සංවිධානය කිරීම සහ ප්‍රදර්ශනයට සහභාගී වීම. 2020 පෙබරවාරි 25- 27 පැවැත්විණි.

3.12 පුනරුත්ථාපන සහ ඉදි කිරීම්

කොන්ත්‍රාත් නම, අංකය, කොන්ත්‍රාත්තකරු	කොන්ත්‍රාත් මුදල - රු
අබගහ මුල ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම- දේශීය වෛද්‍ය විද්‍යායතනය IIM/AA/1/6 ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (පිරිනැමීමේ ලිපි දිනය : 17.12.2020)	**රු. 4,802,925/=**

04. ශිෂ්‍ය පැතිකඩ:

4.1 BAMS සහ BUMS උපාධි වැඩසටහන් පිළිබඳ විස්තර

(i) ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (BAMS)

(ii) යුනානි වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (BUMS)

මෙම පාඨමාලා වසර පහක 05 ආයතනික අධ්‍යයන පුහුණුවකින්ද එක් වර්ෂයක සීමාවාසික වෛද්‍ය පුහුණුවකින්ද සමන්විත වේ. නව පාඨමාලාවේ ප්‍රධාන දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත් වේ. දේශන කටයුතු විද්‍යායතනය තුළ පවත්වනු ලබන අතර සායනික අධ්‍යයන කටයුතු මූලිකව බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල ආශ්‍රිතව සිදු කෙරේ.

නව අධ්‍යයන පාඨමාලාව සමාසික ක්‍රමය යටතේ පවත්වාගෙන යනු ලැබේ. එක් එක් අධ්‍යයන වසර සමාසික දෙකකින් සමන්විත වේ. එක් සෙමස්තරයකට සති 15ක් ඇතුළත් වේ. සෑම සමාසිකයක් අවසානයේම විභාගයක් පැවැත්වේ.

4.2 ආයුර්වේද සහ යුනානි උපාධි වැඩසටහන්වල ඉලක්ක සහ අරමුණු

ඉලක්කය 1: දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනයට ඇති ඉල්ලුම වැඩි කිරීම
අරමුණු:
(i) දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ශක්තිමත් කිරීම
(ii) රැකියා නියුක්තිකභාවය වැඩි කිරීම

ඉලක්කය 2: අධ්‍යයන වැඩසටහන්වල විශිෂ්ටත්වය ළඟා කර ගැනීම
අරමුණු:
(i) සුදුසු ආකෘෂණ සහ අධ්‍යාපන ක්‍රම උපයෝගී කර ගනිමින් උපාධිධාරී ගුණාංග වැඩි දියුණු කිරීම
(ii) ගෝලීය ප්‍රමිතියට සමාන්තරව උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම

ඉලක්කය 3: පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව තුළ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම
අරමුණු:
(i) IIM හි පර්යේෂණ සංස්කෘතිය ශක්තිමත් කිරීම
(ii) දේශීය හා විදේශීය ආයතන සමඟ පර්යේෂණ ජාල ශක්තිමත් කිරීම
(iii) නවෝත්පාදනය සහ ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය

ඉලක්කය 4: රටේ සමාජ ආර්ථික සංවර්ධනය සහතික කිරීම
අරමුණු:
(i) සමාජයේ අවශ්‍යතා හඳුනා ගැනීමෙන් සහ ඒවාට පිළියම් යෙදීමෙන් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම
(ii) IIM හි සමාජයීය සමගිය සහතික කිරීම
(iii) දේශීය වෛද්‍ය නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය
(iv) සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම රැක ගැනීම

ඉලක්කය 5: IIM හි ජාතික සහ ජාත්‍යන්තර පිළිගැනීම සහතික කිරීම
අරමුණු:
(i) IIM හි ජාතික සහ ජාත්‍යන්තර දෘශ්‍යතාව සහතික කිරීම
(ii) අධ්‍යයන විශිෂ්ටත්වයේ දෘශ්‍යතාව සහතික කිරීම
(iii) UOC ශ්‍රේණිගත කිරීම ශක්තිමත් කිරීම හරහා ඉහළ ගෝලීය ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම

ඉලක්කය 6: භෞතික සහ සෞන්දර්යාත්මක පරිසරය වැඩිදියුණු කිරීම සහ IIM හි පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහතික කිරීම.
අරමුණු:
(i) භෞතික පරිසරය වැඩි දියුණු කිරීම
(ii) සෞන්දර්යාත්මක පරිසරය වැඩි දියුණු කිරීම
(iii) පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහතික කිරීම

ඉලක්කය 7: යහපත් පරිපාලනය සහ තිරසාරභාවය සහතික කිරීම
අරමුණු:
(i) ඉහළ මට්ටමේ කුසලතා පූර්ණ කාර්ය මණ්ඩල සමූහයක් ඇති කිරීම
(ii) සෑම මට්ටමකදීම කාර්යක්ෂම හා අපක්ෂපාතී පරිපාලනයක් සැපයීම
(iii) ප්‍රධාන සැලසුම සංවර්ධනය කිරීම

පසුගිය වසර හය තුළ උපාධිධාරී ප්‍රතිදානය

උපාධිධාරී වසර			එකතුව
	ආයුර්වේද	යුනානි	
2020	106	50	**156**
2019	120	17	**137**
2018	93	26	**119**
2017	85	27	**112**
2016	79	23	**102**
2015	63	17	**80**

4.3 උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම (31.12.2020 දිනට)



දේශීය වෛද්‍ය විද්‍යායතනය
කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය
උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම (31.12.2020 දිනට)

බඳවා ගැනීම	ආයුර්වේද			යුනානි		
	පිරිමි	කාන්තා	එකතුව	පිරිමි	කාන්තා	එකතුව
2018/19 (1වන වසර)	35	142	**177**	8	43	**51**
2017/18 (1වන වසර)	41	128	**169**	4	42	**46**
2016/17 (2වන වසර)	34	140	**174**	6	43	**49**
2015/16 (3වන වසර)	31	119	**150**	3	29	**32**
2014/15 (4වන වසර)	28	103	**131**	12	33	**45**
2013/14 (5වන වසර)	27	106	**133**	7	35	**42**
එකතුව	**196**	**738**	**934**	**40**	**225**	**265**

මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව:- 1199

4.4 ශිෂ්‍ය සුබසාධනය

4.4.1 මූල්‍ය සහාය

ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ලෙස ශිෂ්‍යයන්ට මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

(i) **<u>මහපොළ ශිෂ්‍යත්ව</u>**

මාසික දීමනාව රු. 5000/- ශිෂ්‍යයකුට මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදලේ දායකත්වය සමගින් කුසලතා හෝ සාමාන්‍ය පදනම මත පිරිනමනු ලැබේ.

(ii) **<u>ශිෂ්‍යාධාර</u>**

මාසික දීමනාව රු.4000/- හෝ රු. 3900/- ශිෂ්‍යයකුට ගෙවන සම්පූර්ණ හෝ අර්ධ ශිෂ්‍යත්වයක් ලෙස.





ශිෂ්‍යයින් සඳහා මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ප්‍රතිශත

වසර	ශිෂ්‍ය සංඛ්‍යාව (මහපොළ)	ප්‍රතිශතය (%)	ශිෂ්‍ය සංඛ්‍යාව (ශිෂ්‍යාධාර)	ප්‍රතිශතය (%)
2018/2019 (1වන වසර)	112	49.12%	22	9.64%
2017/2018 (1වන වසර)	93	42.50%	51	23.72%
2016/2017 (2වන වසර)	71	31.83%	116	52.01%
2015/2016 (3වන වසර)	56	30.76%	90	49.45%
2014/2015 (4වන වසර)	65	36.72%	82	46.59%
2013/2014 (5වන වසර)	72	40.90%	70	40.00%
එකතුව	**469**	**39.11%**	**431**	**35.94%**

මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර මූල්‍ය වටිනාකම

වසර	ශිෂ්‍ය සංඛ්‍යාව (මහපොළ)	මුදල	ශිෂ්‍ය සංඛ්‍යාව (ශිෂ්‍යාධාර)	මුදල
2018/2019 (1වන වසර)	112	2856000.00	22	528000.00
2017/2018 (1වන වසර)	93	3305000.00	51	1556000.00
2016/2017 (2වන වසර)	71	2375000.00	116	3196000.00
2015/2016 (3වන වසර)	56	2480000.00	90	3123500.00
2014/2015 (4වන වසර)	65	2255000.00	82	2278400.00
2013/2014 (5වනවසර)	72	2495000.00	70	1648800.00
එකතුව	**469**	**15766000.00**	**431**	**12330700.00**

4.4.2 ශිෂ්‍ය නේවාසිකාගාර

ප්‍රධාන නේවාසිකාගාර දෙකක් විද්‍යායතනයේ සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමට පවත්වාගෙන යනු ලැබේ.

කාන්තා නේවාසිකාගාරය - 2020.12.31

වසර	කාන්තා නේවාසිකාගාරය - මොරගස්මුල්ල අංක 330	
	ආයුර්වේද	යුනානි
1වන වසර (2018/2019)	**107**	**34**
1වන වසර (2017/2018)	**29**	**18**
2වන වසර (2016/2017)	-	-
3වන වසර (2015/2016)	32	-
4වන වසර (2014/2015)	38	16
5වන වසර (2013/2014)	84	23
එකතුව	**290**	**91**

පිරිමි නේවාසිකාගාරය -2020.12.31

වසර	අංක. 12, මැදවැලිකඩ නේවාසිකාගාරය සහ ඇසල උයන නේවාසිකාගාරය සහ තලංගම දකුණ පිරිමි නේවාසිකාගාරය			
	ආයුර්වේද	යුනානි	එකතුව	නේවාසිකාගාරයේ නම
1වන වසර (2018/2019)	22	5	27	අංක 12 නේවාසිකාගාරය
1වන වසර (2017/2018)	28	02	30	ඇසල උයන නේවාසිකාගාරය – 17 තලංගම දකුණ නේවාසිකාගාරය –13
2වන වසර (2016/2017)	-	-	-	-
3වන වසර (2015/2016)	6	-	6	ඇසල උයන නේවාසිකාගාරය
4වන වසර (2014/2015)	8	2	10	මැදවැලිකඩ නේවාසිකාගාරය
5වන වසර (2013/2014)	8	1	9	
එකතුව	**72**	**10**	**82**	

4.5 ආයතනයේ ශිෂ්‍ය සංගම්

මෙම ආයතනයේ ශිෂ්‍ය සංගමය දේශීය වෛද්‍ය ශිෂ්‍ය කමිටුව ලෙස ක්‍රියාත්මක වේ. එය සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නිලධාරී මණ්ඩලයකින් සමන්විත වේ. මෙම ශිෂ්‍ය කමිටුව යටතේ ප්‍රධාන අනු කමිටු තුනක් (03) ක්‍රියාත්මක වේ.

i. කලා අනුකමිටුව

කලා හා සංස්කෘතික කටයුතු, කලා උළෙල සංවිධානය කිරීම සහ සිසුන්ගේ කලා කටයුතු වර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.

ii. ආයුර්වේද ව්‍යාප්ති අනුකමිටුව

මේ යටතේ පාසල්වල ආයුර්වේදය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම, ජංගම සායන සහ ප්‍රජා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම, කුකුස නමින් සංවාද වැඩසටහනක් පැවැත්වීම යනාදී ක්‍රියා සිදු කෙරේ.

iii. ක්‍රීඩා අනුකමිටුව

වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ අවුරුදු උත්සවය සංවිධානය කිරීම, නවක සිසුන්ගේ ක්‍රීඩා උළෙල පැවැත්වීම, විවිධ ක්‍රීඩා සඳහා සිසුන් යොමු කිරීම හා කාය වර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම මෙමගින් සිදු කෙරේ.

4.6 ආයුර්වේද ශික්ෂණ රෝහල

ආයුර්වේද ශික්ෂණ රෝහල දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය උපාධි අපේක්ෂකයන්ට සායනික පුහුණුව ලබා දීම සහ රෝගී ප්‍රතිකාර සේවය සඳහා වෙන් වී ඇත. මෙය රෝහල් අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන අතර විද්‍යායතනයට මීටර් 100ක් පමණ දුරින් කොටා පාරේ පිහිටා ඇත

මෙම සායනික කටයුතු සඳහා දේශීය වෛද්‍ය විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයද සහභාගි වන අතර ඒ අනුව සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට මෙන්ම ආයුර්වේද ශික්ෂණ රෝහලට පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමටද ඔවුන්ගේ දායකත්වය ලැබේ.

5. මූල්‍ය සහ ගිණුම්කරණ විස්තර

5.1 මූල්‍ය විශ්ලේෂණය

1. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂය	2020 රු.	2019 රු.
1. පුද්ගල චේතන	504,769,779	442,640,989
2. ගමන් වියදම්	23,025	702,575
3. සැපයුම්	10,199,419	14,524,958
4. නඩත්තු	3,485,740	4,190,572
5. කොන්ත්‍රාත්තුමය සේවා	41,038,689	50,183,282
6. වෙනත්	9,098,420	16,487,906
එකතුව	**568,614,072**	**528,730,282**

11. ප්‍රාග්ධන වියදම් විස්තර

විෂය	2020	2019
අ. පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීම්	1,717,078	10,574,810
ආ. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්	21,042,147	41,586,377
ඇ. මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය	136,498	1,042,503
ඈ. ශක්තිමත් කිරීම සහ පර්යේෂණ	802,200	2,780,532
එකතුව	**23,697,923**	**55,984,222**

111. මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්)

විෂය	ප්‍රතිපාදන 2020 රු.	වියදම් 2020 රු.	ඉතුරුම්/අතිරික්තය රු.
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	579,320,000	**568,614,072**	10,705,928
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	24,000,000	**23,697,923**	302,077
ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල්කරණය කළ	-	-	-
ඈ. ව්‍යාපෘති – විදේශීය අරමුදල්කරණය කළ	-	-	-
එකතුව	**603,320,000**	**592,311,995**	**11,008,005**

IV. මූල්‍ය ප්‍රගතියේ විස්තර (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	**ප්‍රතිපාදන 2020 රු.**	**රැස් කිරීම් 2020 රු.**
අ. උපාධි අපේක්ෂක අධ්‍යයන	-	-
ආ. පශ්චාත් උපාධි අපේක්ෂක අධ්‍යයන PG/MD	-	-
ඇ. උපදේශන	-	-
ඈ. ආයුර්වේද සම්බාහන චිකිත්සාව පිළිබඳ වෙනත් ඩිප්ලෝමා පාඨමාලා සහතික පත්‍ර පාඨමාලාව 2020	700,000	506,000
එකතුව	**700,000**	**506,000**

V. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය – 2020

විෂය	**සූත්‍රය**	**විය. ශිෂ්‍යයකුට රු.**
අ. ශිෂ්‍යයකුට පුනරාවර්තන වියදම (RE)	**568,614,072**	405,863
ආ. ශිෂ්‍යයකුට ප්‍රාග්ධන වියදම (CE)	**23,697,923**	16,915
එකතුව	**592,311,995**	**422,778**

*** ප්‍රගති වාර්තාව 2020 QA කවය – IIM; පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී**

i. නිතිපතා තත්ත්ව සහතික කිරීමේ කව රැස්වීම් පැවැත්වූ අතර සියලු නිර්ණායකවල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.

ii. සමහර නව වසම් සම්බන්ධීකාරකවරුන් පත් කරන ලදී

iii. QA කව සම්බන්ධීකාරක ආචාර්ය එ.ම්සි.එම්. මහීස්, Do-omain සම-සම්බන්ධීකාරක පහත පරිදි වේ

නිර්ණායකය 1 - <u>වැඩසටහන් කළමනාකරණය</u>

සම්බන්ධීකාරකවරුන්

අධ්‍යක්ෂ

අංශාධිපති/ ආයුර්වේද

අංශාධිපති/ යුනානි

QA කව සම්බන්ධීකාරක

නියෝජ්‍ය ලේඛකාධිකාරි

නියෝජ්‍ය මූල්‍යාධිකාරි

නිර්ණායකය 2 - **<u>මානව සහ භෞතික සම්පත්</u>**

සම්බන්ධීකාරකවරුන් - ආචාර්ය එස්.එම්.එස්. සමරකෝන්

2019.12.30	R44489	595067	නිපුණතා සංවර්ධන අරමුදල	-	50,000
2019.12.30	R44489	595076	කේජේටීකේ මංජු ශ්‍රී	4,956	4,956
2020.06.26	R45148	595292	එම් වයිඑන් හසීනා	7,977	-
2020.06.26	R45148	595305	ඩබ්ලිව් ඒ ඩී ශ්‍රියානි	5,000	-
2020.06.26	R45148	595443	නලීන් ගුණසිංහ	12,255	-
2020.06.26	R45148	595484	හීරෝ ටෙක්ස්	380	-
2020.06.26	R45148	595592	සුපර් ටෙක් රීෆ් ඉංජිනියරින්ග්	5,586	-
2020.06.26	R45148	595603	යූකේඑම් නදීර්	1,530	-
2020.07.28	R45347	595675	අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස්	42,252	-
2020.10.30	R36922	591223	බැන්ඝන්ස් ෆිටිනස්	69,211	-
2020.12.31	R46115	595707	ඩීඩබ්ලිව්අයි සුරංගි	12,995	-
2020.12.31	R46115	595923	සීපී හෙට්ටිගෙදර	7,200	-
2020.12.31	R46115	50586	කේසී පෙරේරා	1,251	-
2020.12.31	R46115	50624	ලේඛකාධිකාරි කොළඹ විශ්වවිද්‍යාලය	6,000	-
				214,434	**178,712**

උපලේඛනය **F**

ගෙවිය යුතු විභාග ගාස්තු		2020	2019
යොමු.	විස්තරය	මුදල රු.	මුදල රු.
REC 36135	0	8,893	8,893
REC 36136	0	4,980	4,980
REC 41187	වෛද්‍ය ඩබ්. එම්. එම්. එස් .කේ. කුලතුංග සහ අනිකුත්	7,400	7,400
REC 43047	වෛද්‍ය එම්. එච්. ෆවුසල් හක්	-	3,525
REC43090	වෛද්‍ය එම්. එස්. එස්. ෆර්මියා සහ අනිකුත් අය	-	1,600
REC 43091	වෛද්‍ය එස්. ඒ. ඩී. සිරිවර්ධන සහ අනිකුත් අය	-	8,068
REC 43336	වෛද්‍ය පී.ඒ.එස්.එන්. ද සිල්වා	9,525	12,585
REC 43882	වෛද්‍ය එම්.එච්.එම්. නසීම් සහ අනිකුත් අය	-	11,600
REC 43883	වෛද්‍ය එෆ්.එන්. ජමල්ඩීන් සහ අනිකුත් අය	-	3,000
REC 43884	වෛද්‍ය ආර්.ඩී.එච්. කුලතුංග සහ අනිකුත් අය	-	3,480
REC 43885	වෛද්‍ය එල්.පී.ඒ. කරුණාතිලක සහ අනිකුත් අය	-	7,600
REC44465	වෛද්‍ය ආර්. එස්. ජයවර්ධන සහ අනිකුත් අය	-	6,800
REC 44466	වෛද්‍ය බී. එම්. එස්. අමරජීව සහ අනිකුත් අය	1,800	9,000
REC44467	වෛද්‍ය එච්. නිසාම්ඩීන් සහ අනිකුත් අය	-	3,200
REC 44468	වෛද්‍ය ඒ. එච්. එම්. මව්ජූඩ්	-	3,910
REC 44469	වෛද්‍ය ඒ. ආර්. හස්මත්	600	1,200
REC 44470	වෛද්‍ය දයානි සිරිවර්ධන සහ අනිකුත් අය	-	5,200
REC 44471	වෛද්‍ය එච්. නිසාම්දීන් සහ සහ අනිකුත් අය	-	3,400
REC44472	වෛද්‍ය එල්.පී.ඒ. කරුණාතිලක සහ අනිකුත් අය	-	7,400
REC 44473	වෛද්‍ය ජේ. රාමයිසා සහ අනිකුත් අය	-	4,200
REC 44474	වෛද්‍ය එස්. ඩී. හපුආරච්චි සහ අනිකුත් අය	-	6,400
REC 44475	ඒ. එෆ්. එම්. ජූනුස් සහ අනිකුත් අය	600	4,800
REC 45068	එම්. එස් පල්ලී	600	
REC 46038	වෛද්‍ය නජීබ්	1,700	
		36,098	**128,241**

උපලේඛනය **J**

<u>පුණ්‍යස්ථාන අරමුදල</u>	**2020**	**2019**
	මුදල රු.	මුදල රු.
බානගල	10,050	10,050
ජයන්ත එදිරිසිංහ	40,952	41,952
ඒකාබද්ධ අරමුදල	636,467	656,467
ඒපීජී අමරසිංහ	500,000	-
	1,187,469	**708,469**

වවු. අංකය	විස්තරය	2020 රු. මුදල	2019 රු. මුදල
57	අශෝක වෙල්ඩින්	22,940	22,940
68	ආසිරි කන්ස්ට්‍රක්ෂන්ස්	22,935	22,935
69	ඒසිඊ් ලංකා	219,795	219,795
J3996	එනෙක්ස් ඒජන්සීස්	3,290	3,290
J3996	එනෙක්ස් ඒජන්සීස්	26,008	26,008
J4327	ඇනලිටිකල් ඉන්ස්ටෘමන්ට්		1,095,261
J4327	මර්විසන්ස්		34,148
J4400	අයිඑම්එස් හෝල්ඩින්ස්		982,715
J4400	සිංහගිරි (පෞද්.) සමාගම		1,967,796
J4464	ඇල්ෆා ඉන්ඩස්ට්‍රිස්		82,494
J4464	මර්විසන්ස්		271,950
J4464	ටෙක්නොමෙඩීස් ඉන්ටර්නැෂනල	92,500	92,500
J4464	සුමුදු එන්ටර්ප්‍රයිසස්		76,200
J4496	ඔෆිස් නෙට්වර්ක්		148,906
J4496	මෙට්‍රොපොලිටින් කම්පියුටර්ස්		70,475
J4496	ගෙස්ටෙට්නර්		279,835
J4496	ජෝර්ජ් ස්ටුවර්ට් හෙල්ත්		57,637
J4496	ඊ-විස් පෙරිපරල්ස්		214,475
J4499	නෙක්රෝ කන්ස්ට්‍රක්ෂන්		134,768
J4499	සිංහ කන්ස්ට්‍රක්ෂන්		274,144
J4926	ක්‍රාෆ්ට් ලංකා ඉංජිනියරින්	403,650	
		791,118	**6,078,272**

ත්‍යාග සහ පුදාන

උපලේඛනය I

	රු. **2020**	රු. **2019**
පුස්තකාල පොත්	444,159	444,159
කාර්යාල උපකරණ	112,400	112,400
Lash උපකරණ	6,999,800	6,999,800
පන්ති කාමර	266,969	266,969
පොත්	500	500
ග්‍රීන් හවුස්(1999)	840,000	840,000
2000 පුස්තකාල පොත්	4,846	4,846
2001 පුස්තකාල පොත්	23,762	23,762
2004 පුස්තකාල පොත්	88,399	88,399
2005 පුස්තකාල පොත්	80,085	80,085
2006 පුස්තකාල පොත්	1,840	1,840
2007 පුස්තකාල පොත්	12,520	12,520
2007 කාර්යාල උපකරණ	735,784	735,784
2007 වාහනය	146,500	146,500
2008 පුස්තකාල පොත්	16,255	16,255
2010 Irque උපකරණ	5,387,230	5,387,230
2010 පොත්	529,134	529,134
2012 HECT ව්‍යාපෘතිය	1,818,698	1,818,698
2013-පොත්	5,048	5,048
2014 HECT ව්‍යාපෘති - පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	6,111	6,111
2014 HECT ව්‍යාපෘති - කාර්යාල උපකරණ	37,318	37,318
2014-පොත්	1,324	1,324
2015 - පොත්	-	8,821
2015- පරිගණක	-	27,260
2016-පොත්	4,193	11,147
2017 පොත්	29,682	49,116
2018 පොත්	14,856	19,808
2019 පොත්	6,976	9,043
කොළඹ විශ්වවිද්‍යාලය (Fundus කැමරාව)	181,547	240,427
පොත් 2020	6,339	-
	17,802,275	**17,924,304**

දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ විශ්වවිද්‍යාලය

31.12.2020 දිනට ශේෂ පිරික්සුම

	විස්තරය	හර	බැර
		රු.	රු.
111001	ප්‍රාග්ධන		394,441,071.05
111002	වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන		2,215,291.10
111003	කුසලතා වැඩි දියුණු කිරීම සහ කාර්මික		54,875.37
111004	අමාත්‍යාංශ ප්‍රදාන - දිරිමත් කිරීම		248,595.00
113002	DAFP/2006/07 වෛද්‍ය එදිරිවීර		64,267.10
113004	විශේෂ අරමුදල - වෛද්‍ය අනෝමා ජයසිරි		300.00
113005	DAFP/2010/12- වෛද්‍ය අනෝමා සමරවික්‍රම		29,295.00
113006	DAFP/2010/03-වෛද්‍ය ජීවනී		15,333.00
11320	UGC/Ph.D වෛද්‍ය M.S. පිල්ලෙයි		412.00
122001	පොදු සංචිතය	278,560,428.42	
131003	ප්‍රත්‍යාගණන සංචිතය		2,468,420,419.52
132006	පර්යේෂණ අරමුදල - වෛද්‍ය හපුආරච්චි		10,597.89
132008	හෙසජ්ජ (සහතික පත්‍ර පාඨමාලාව)		7,000.00
134002	ත්‍යාග සහ ප්‍රදාන		17,802,275.11
1333	අධ්‍යක්ෂකගේ අරමුදල		19,158.00
1334	අංශීය සංවර්ධන අරමුදල-ද්‍රව්‍යාගුණ		217,310.00
1334/1	අංශීය සංවර්ධන අරමුදල-පශ්චාත් උපාධි		92,562.19
1335	අධ්‍යයනාංශ සංවර්ධන අරමුදල		68,750.45
1336	ආයතන සංවර්ධන වැය ශීර්ෂය		207.18
16101006	වෙනත් තැන්පතු(ඉන්ධන තැන්පතු)	97,500.00	
16101007	ලංසු බැඳුම්කර		94,890.00
16101008	ආරක්ෂක තැන්පතු		30,000.00
16101011	ආපන ශාලාව සඳහා තැන්පතු		40,000.00
16101013	ක්ෂය සඳහා ප්‍රතිපාදන		276,890,882.09
16101016	අවලංගු වූ චෙක්පත්		214,432.80
16101019	නොගෙවූ විභාග ගාස්තු		36,098.00
161011020	පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		228,149,045.16
163002	උපචිත වියදම්		7,354,327.08
163003	ගෙවිය යුතු මුද්දර ගාස්තු		3,225.00
163004	විවිධ ණයගැතියන්- ප්‍රාග්ධන		393,190.00
163006	උපචිත වියදම් - PG-යුනානි		261,387.78
163007	උපචිත වියදම් - PG-ආයුර්වේද		12,074.33
163013	උපචිත හෙසජ්ජ - 14/16		84,399.69
163015	උපචිත- සම්භාහන චිකිත්සාව		244,924.79
163018	උපචිත- කපින්ග් චිකිත්සාව - A		14,125.00
163019	උපචිත- කපින්ග් චිකිත්සාව - B		55,073.00
163020	උපචිත- හිජාමා (II)		48,054.30
163021	උපචිත හෙසජ්ජ - 17/18		389,532.31

17101004	ශාන්ති ලංකා		250,000.00
17101005	ගෙවිය යුතු WHT		56,595.00
17101006	UGC වෙත ගෙවිය යුතු		282.00
17101008	කාර්ය මණ්ඩල සුබසාධන අරමුදල		11,356.00
17101009	ගෙවිය යුතු ගෙවීම්ලානියා		27,449.96
17101012	උපචිත රූපලාවන්‍ය පාඨමාලාව		16,006.55
17101013	උපචිත ඉලාජ් ජසඩීන් (කායික චිකිත්සාව)		67,250.00
17101014	උපචිත සම්බාහන චිකිත්සාව 2018		224,726.59
17101017	උපචිත හෙසජ්ජ සහතික පත්‍ර පාඨමාලාව		4,176.00
17101021	හෙසජ්ජ ඩිප්ලෝමා පාඨමාලාව		17,000.00
17101025	ගෙවිය යුතු සම්බාහන චිකිත්සා පාඨමාලාව 2018		15,000.00
17101026	UGC ප්‍රදානය - P.A.S.N.සිල්වා		290,305.00
17101027	NSF ප්‍රදානය		11,838.00
17101028	සම්බාහන චිකිත්සා පාඨමාලාව 2019		29,000.00
17101029	හෙසජ්ජ සහතික පත්‍ර 2019		1,000.00
17101033	ගෙවිය යුතු අඛණ්ඩ වෛද්‍ය අධ්‍යා.		5,403.60
17101030	පෙර ලැබුණු නේවාසිකාගාර ගාස්තු		135,500.00
17101035	ටැබ් පරිගණකය		10,393.00
4217	කොයින්ස් රවුන්ඩ් අප්		4,116.21
2101004	ඉඩම්	2,372,019,019.34	
2101038	ප්‍රාග්ධන- ගොඩනැගිලි-103	432,254,577.08	
2101041	වාහන ගිණුම	35,313,079.79	
2101068	ප්‍රාග්ධන- ශිෂ්‍ය මධ්‍යස්ථාන ඉගෙනුම්	537,160.52	
2102007	ප්‍රාග්ධන- පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර	29,694,896.24	
2102008	ප්‍රාග්ධන- ක්‍රීඩා උපකරණ - 3	3,619,567.00	
2103002	ප්‍රාග්ධන-කාර්යාල, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ-	62,948,338.40	
2103004	ගෘහ භාණ්ඩ සහ වෙනත්	47,485,836.58	
2104001	ප්‍රාග්ධන-පොත් සහ වාර සඟරා	42,738,798.00	
2109001	ප්‍රාග්ධන-පිරියත සහ යන්ත්‍රෝපකරණ	41,234,450.09	
2109002	ආයෝජන ගිණුම- එදිරිසිංහ	51,029.52	
2109008	ආයෝජන ගිණුම- 5,000,000/-	8,622,175.34	
2109009	ඒකාබද්ධ ශිෂ්‍යත්ව අරමුදල	640,870.16	
2109010	මහාචාර්ය A P G අමරසිංහ	500,000.00	
2109011	ස්ථාවර තැන්පතුව	5,537,634.56	
221002	පුණ්‍යස්ථාන අරමුදල - ජයන්ත එදිරිසිංහ		40,951.96
221004	පුණ්‍යස්ථාන අරමුදල - බානගල		10,050.00
221006	පුණ්‍යස්ථාන අරමුදල - ඒකාබද්ධ අරමුදල		636,467.32
221007	පුණ්‍යස්ථාන අරමුදල - අමරසිංහ		500,000.00
225001	රඳවා ගත් මුදල් ප්‍රාග්ධන		791,118.60
2301001	ගබඩා අත්තිකාරම් ගිණුම	2,443,768.87	
2301002	සංක්‍රාම	362.43	
2302012	අධි තැන්පතු		2,718.28
2302013	පෙරදිග වෛද්‍ය අරමුදල		170,000.00
2303001	ආපදා ණය	9,496,882.00	
2303002	කාර්ය මණ්ඩල ණය	55,590.00	
2303003	වාහන ණය	979,358.00	
2303004	පරිගණක ණය	497,000.00	
2303009	උත්සව අත්තිකාරම්	52,250.00	
2305001	විවිධ අත්තිකාරම්		946.22
2305012	පොත් අත්තිකාරම්	460,054.20	
2305016	විවිධ අත්තිකාරම්- MD	4,565.92	
2310001	P.B- බොරැල්ල-078100192268358	6,483,999.94	
2310002	P.B- බොරැල්ල-07810012268390	2,215,291.10	
2310003	P.B- බොරැල්ල-07810012268432	1,924,195.14	
2310004	P.B- බොරැල්ල-078100172268458	1,634,200.49	
2310005	ඉතුරුම් ගිණුම-078-2-001-7-22683	282,800.51	
2312001	කලින් ගෙවීම්	409,723.81	
2313004	සුළු මුදල් - නඩත්තු	2.00	

2314006/2	ලැබිය යුතු ශිෂ්‍යාධාර - UGC	2,829,200.00	
2314006/3	ආයෝජනවලින් ලැබිය යුතු පොලි	103,836.13	
27010	ලැබිය යුතු පුස්තකාල දඩ	4,970.00	
27013	ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු	286,900.00	
27014	එක් දින තැන්පතු ආයෝජන	1,620,025.94	
301B	රාජ්‍ය ප්‍රදාන-පුනරාවර්තන		579,320,000.00
302	ආයෝජනවලින් පොලි		1,915,457.77
30205	ලැබුණු ශිෂ්‍යාධාර UGC		14,394,600.00
30312	ක්‍රමක්ෂය ආදායම		49,438,076.00
303	ණයවලින් පොලී		436,092.42
306	දේපළවලින් කුලිය		36,690.00
308C	විවිධ ආදායම්		104,372.60
310010	විභාග ගාස්තු		80,401.00
310011	නේවාසිකාගාර ගාස්තු		314,600.00
310012	සහතික ආදායම		123,885.00
310015	ටෙන්ඩර ගාස්තු		19,500.00
310016	ලියාපදිංචි ගාස්තු		486,710.00
318	පුස්තකාල දඩ		26,687.00
3108A	පැරණි ගබඩා විකිණීම		80,000.00
340	පුනරාවර්තන ස්වභාවයෙහි ප්‍රාග්ධන වියදම්		2,655,776.00
348	ERC කමිටුව		12,000.00
351	සම්බාහන චිකිත්සා පාඨමාලාව 2020		506,000.00
350	Sales of Assets	110,647.00	
410102	ගමන් වියදම් සහ දීමනා	22,400.00	
410103	සැපයුම්	4,571,663.98	
410104	නඩත්තු	3,014,048.61	
4101041	පුද්ගල වේතන-අධ්‍යයන	8,110,934.04	
4101042	පුද්ගල වේතන-NA	40,190,951.42	
410105	කොන්ත්‍රාත්තුමය සේවා	40,618,081.34	
410106	වෙනත් පුනරාවර්තන වියදම්	3,943,564.26	
410112	බැංකු ගාස්තු	16,300.00	
410203	සැපයුම්	379,006.42	
410204	නඩත්තු	139,000.00	
4102041	පුද්ගල වේතන-අධ්‍යයන	32,058.48	
4102042	පුද්ගල වේතන-NA	19,708,496.78	
410205	කොන්ත්‍රාත්තුමය සේවා	96,773.62	
410206	වෙනත් පුනරාවර්තන වියදම්	134,338.97	
410503	සැපයුම්	1,810,618.85	
410504	නඩත්තු	222,740.53	
4105041	පුද්ගල වේතන-අධ්‍යයන	6,007.97	
4105042	පුද්ගල වේතන-NA	13,194,105.29	
410505	කොන්ත්‍රාත්තුමය සේවා	11,120.00	
410506	වෙනත් පුනරාවර්තන වියදම්	200.00	
420902	ගමන් වියදම් සහ දීමනා	625.00	
420903	සැපයුම්	2,623,025.44	
420904	නඩත්තු	37,910.00	
4209041	පුද්ගල වේතන-A	336,919,838.91	

4209042	පුද්ගල වේතන-NA	47,044,857.75	
420905	කොන්ත්‍රාත්තුමය සේවා	5,667.14	
420906	වෙනත් පුනරාවර්තන වියදම්	4,934,246.81	
422310	ශිෂ්‍යයන්ට මූල්‍ය සහාය	14,394,600.00	
430103	සැපයුම්	571,950.97	
430104	නඩත්තු	7,950.00	
4301041	පුද්ගල වේතන-A	8,933,861.26	
4301042	පුද්ගල වේතන-NA	12,619,626.78	
430105	කොන්ත්‍රාත්තුමය සේවා	296,092.38	
430106	වෙනත් පුනරාවර්තන වියදම්	69,770.00	
440117	විගණන ගාස්තු	750,000.00	
450312	වෙනත් මෙහෙයුම් වියදම්	22,825,238.20	
480103	සැපයුම්	243,153.36	
480104	නඩත්තු	64,090.00	
4801042	පුද්ගල වේතන- NA	2,863,442.29	
480105	කොන්ත්‍රාත්තුමය සේවා	10,955.00	
49001	ක්ෂය ගිණුම	63,457,807.00	
49009	මානව ප්‍රාග්ධන සංවර්ධනය	136,498.00	
49010	පර්යේෂණ ශක්තිමත් කිරීම	802,200.00	
49029	පුනරුත්ථාපන වියදම්	1,717,078.00	
		4,051,303,879.37	**4,051,303,879.37**

දේශීය වෛද්‍ය විද්‍යායතනය - කොළඹ විශ්වවිද්‍යාලය
අයවැය වෙන් කිරීම් සහ සත්‍ය පුනරාවර්තන වියදම් - 2020

ක්ෂේත්‍රය			අනුමත අයවැය	සත්‍ය	අතිරික්තය හෝ	හේතු
2019	අංක.		2020	2020	ඌනතාව	
1	2	3	4	5	6 (4-5)	7
442,640,989	1	පුද්ගල වේතන	526,770,000	512,257,165	14,512,835	පාරිතෝෂික ගෙවීම් දීර්ඝ කර ඇත. වසංගත තත්ත්වය හේතුවෙන් අනිකාල වියදම් අඩුය
702,575	2	ගමන් වියදම්	135,000	23,025	111,975	අඩු විදේශීය හා දේශීය සංචාර හේතුවෙන්
14,524,958	3	සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය	6,422,000	10,199,419	- 3,777,419	වසංගත තත්ත්වය හේතුවෙන් මිල වැඩි වීම සහ වෛද්‍ය උපකරණ වැඩිපුර මිලදී ගැනීම හේතුවෙන්.
4,190,572	4	නඩත්තු	2,418,000	3,485,740	- 1,067,740	වාහන අලුත්වැඩියාව වැඩි වීම හේතුවෙන් (ත්‍රී වීලර්) සහ ගොඩනැගිලි අලුත්වැඩියාව හේතුවෙන්)
50,183,282	5	කොන්ත්‍රාත්තුමය සේවා	38,880,000	41,038,689	- 2,158,689	වැඩි නේවාසිකාගාර කුලී සහ අන්තර්ජාල වියදම් හේතුවෙන්.
16,487,906	6	වෙනත් පුනරාවර්තන වියදම්	6,193,000	9,098,420	- 2,905,420	උපචිත විගණන වියදම්, විභාග වියදම් ගෙවීම හේතුවෙන්.
528,730,282		**මුළු පුනරාවර්තන වියදම්**	**580,818,000**	**576,102,458**	**4,715,542**	

දේශීය වෛද්‍ය විද්‍යායතනය - කොළඹ විශ්වවිද්‍යාලය
අයවැය වෙන් කිරීම් සහ සත්‍ය ප්‍රාග්ධන වියදම් - 2020

2019	අංක.		අනුමත අයවැය 2020	සත්‍ය 2020	අතිරික්තය හෝ ඌනතාව	හේතු
1	2	3	4	5	6 (4-5)	7
10,574,810	1	ස්ථාවර වත්කම් පුනරුත්ථාපන	3,100,000	2,347,200	752,800	වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති කිහිපයක් කල් දමා ඇත.
41,586,377	2	ස්ථාවර වත්කම් අත්පත් කර ගැ	19,700,000	18,603,437	1,096,563	පසුගිය මාසයේ මිලදී ගැනීම් සඳහා ගෙවීම් ප්‍රමාද වී ඇත.
1,042,503	3	මානව ප්‍රාග්ධන සංවර්ධන	500,000	136,498	363,502	වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වූ පුහුණු වැඩසටහන් ගණන අඩුය.
2,780,532	4	මූළු ප්‍රාග්ධන වියදම	700,000	802,200	- 102,200	නව පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කර ඇති අතර පුස්කොළ පොත් සංරක්ෂණ ව්‍යාපෘතිය අවසන් කර ඇත.
55,984,222		**මූළු ප්‍රාග්ධන වියදම**	**24,000,000**	**21,889,335**	**2,110,665**	

විද්‍යායතනයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය

1. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1. පොදු ප්‍රතිපත්ති

1.1.1 වාර්තාකරණ අස්ථිත්වය

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ අංක 67/14 දරන ආඥා පනත යටතේ 1980.01.01 දින සංස්ථාපිත ආයතනයකි.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ආයතනයේ වත්කම්, වගකීම්, ශුද්ධ වත්කම්, ආදායම, වියදම් හා සියලුම මෙහෙයුම්වල වෙනත් ගනුදෙනු නිරූපණය වේ.

1985 අංක 07 දරන (සංශෝධිත) විශ්වවිද්‍යාල පනත සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත ඇතුළුව පසුකාලීන පනත්වලින් සංශෝධිත විශ්වවිද්‍යාල පනතේ 106 (1), (2) සහ 107(ආ) වගන්ති ප්‍රකාරව මූල්‍ය පරිපාලනය මඟින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

දේශීය වෛද්‍ය විද්‍යායතනය ආයුර්වේදය, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වල උපදෙස් ලබා දෙන ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනය වේ. ආයුර්වේද විද්‍යාලය දිවයින තුළ මුලින්ම පිහිටුවන ලද ආයතනය වන අතර පසුව 1977 වසරේ දී එම ආයතනය දේශීය වෛද්‍ය විද්‍යායතනය ලෙස කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යායතනය මූලික සෞඛ්‍ය රැකවරණය, පොදු සෞඛ්‍ය රැකවරණ ගැටලු, සෞඛ්‍ය නහා සිටුවීම සහ රෝග නිවාරණය යන අභියෝගාත්මක අවශ්‍යතා ඉටු කරනු වස් වෛද්‍ය වෘත්තිකයින් බිහි කරයි.

ආයතනය මූලික වශයෙන් රජයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වේ.

1.1.3 පිළියෙළ කිරීමේ පදනම

(i) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම ප්‍රකාශන පිළියෙළ කර ඇත.

(ii) මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර ප්‍රකාශ කර ඇති අවස්ථා හැරුණු කොට මූල්‍ය වටිනාකම්වල වෙනස් වීම් සැලකිල්ලට ගෙන නොමැත. පිරිවැය වත්කම් සඳහා හුවමාරුවල දී ඇති සාධාරණ වටිනාකම මත පදනම් වේ.

(iii)කෘත්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය ආයතනයේ කෘත්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ.

1.2 වත්කම් සහ ඒවායේ වටිනාකම සඳහා පදනම්

1.2.1 දේපළ, ගෘහභාණ්ඩ, පිරියත හා උපකරණ

ආයතනයේ ඉඩම සහ ගොඩනැගිලි, කාර්යාලය, විද්‍යාගාරය හා ඉගැන්වීම් උපකරණ, ගෘහභාණ්ඩ සහ සවි කිරීම් හා වාහන ප්‍රත්‍යාගණනය කර, 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගිණුම්වල හඳුනා ගෙන ඇත. කාල සීමාව තුළ දී මිල දී ගෙන ඇති දේපළ, පිරියත හා උපකරණ, පුස්තකාල පොත් සහ කොන්ක්‍රීට් බංකු පිරිවැයට දක්වා ඇත.

ක්ෂය වීම් ප්‍රත්‍යාගණනය කළ වටිනාකම මත සහ මිල දී ගැනීමේ පිරිවැය මත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට අය කර ඇත. පහත වාර්ෂික අනුපාත යොදා ගෙන ඇත.

ගොඩනැගිලි	5%
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	10%
කාර්යාල විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ	20%
පරිගණක	20%
මෝටර් වාහන	20%
පුස්තකාල පොත්	20%
ක්‍රීඩා උපකරණs	20%
පිරියත සහ යන්ත්‍රෝපකරණ	20%
අර්ධ ස්ථාවර දේශන ශාලාව	5%
කොන්ක්‍රීට් බංකු	20%

2020 වර්ෂය සඳහා ක්ෂය වීම් වෙනුවෙන් රු. මිලියන 63.5ක මුදලක් ලබා දී ඇත. එය රු. මිලියන 7.9කින් අර්ධ ස්ථිර දේශන ශාලාවේ එක් කිරීම් හේතුවෙන් වැඩි වී ඇත.

සියලුම ස්ථාවර වත්කම්වල (රජයේ ප්‍රදානවලින් මිලදී ගත්, 2016.01.01 දිනට ප්‍රත්‍යාගණනය කළ, ත්‍යාග සහ පරිත්‍යාග ලෙස ලැබූ) ක්ෂයවීම් ක්‍රමක්ෂය කර ඇත.

යටිතල පහසුකම්, පිරියත සහ උපකරණවල වටිනාකම, වසර තුළදී ප්‍රධානවම අඩු මිලදී ගැනීම, අඩු ප්‍රාග්ධන ප්‍රදාන සහ වැඩි බැහැර කිරීම් නිසා රු. මිලියන 35.8කින් සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

2020.12.31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කළ පුස්තකාල පොත්වල වටිනාකම රු. 25,865,542 කි.

1.2.2 තොග

තොග පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

තොග වටිනාකම 2019 වසරට වඩා රු. මිලියන 0.5කින් පමණක් මද වශයෙන් අඩු වී ඇත.

1.2.3 ලැබිය යුතු දේ

ලැබිය යුතු දෑ ඒවා නිෂ්කාශණයට ඇස්තමේන්තු කළ මුදල අනුව දක්වනු ලැබේ

ලැබිය යුතු දෑ රු. මිලියන 0.9කින් අඩු වී ඇත.

1.2.4 කෙටි කාලීන ආයෝජන

සමහර ආයෝජන එහි පොලිය සමග නැවත අලුත් කර ඇත.

ස්ථාවර තැන්පතු ආපසු ලබා ගැනීමේ ශේෂය නැවත ආයෝජනය කිරීම සහ එක් දින තැන්පතුවේ වැඩි වීම නිසා ආයෝජන රු. මිලියන 7.9කින් වැඩි වී ඇත.

1.3 වගකීම් හා ප්‍රතිපාදන

2020.12.31වන දිනට සියලු දන්නා වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබෙන අතර දන්නා නමුත් මුදල නිවැරදිව තීරණය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත.

ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් හෝ වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. රඳවා ගැනීමේ මුදල් ගෙවීම හේතුවෙන් ගෙවිය යුතු දේ රු. මිලියන 5කින් අඩු වී ඇත.

ණය හිමියන් සඳහා ගෙවීම් සිදු කර තිබීම හේතුවෙන් උපචිත වියදම් සහ විවිධ ණය හිමියන් ද පිළිවෙළින් රු. මිලියන 3.5කින් සහ රු. මිලියන 9.5කින් අඩු වී ඇත.

2020.12.31වන දිනට ආයතනයට එරෙහිව අධිකරණ නඩු කටයුතු 13ක් තිබෙන අතර එම නඩුකර සඳහා වැයවෙන බවට ඇස්තමේන්තු කළ මුදල රු. මිලියන 1.3කි.

1.3.1 ප්‍රදාන සඳහා ගිණුම්කරණය

ආයතනය විසින් වියදම් සඳහා දැරූ මුදල් සඳහා වූ වන්දි පූරණය කරන ප්‍රදාන වියදම් හඳුනා ගෙන ඇති කාල සීමාව තුළදීම මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනා ගෙන ඇත. වත්කම්වල පිරිවැය සඳහා ආයතනයට වන්දි පූරණය කරන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් කාල සීමාව සඳහා ක්‍රමානුකූල පදනම මත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

1.3.2 සේවක ප්‍රතිලාභ

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි ආදී සාධක මත විශ්‍රාම යාමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය සඳහා ප්‍රතිලාභ සැලසුමක් නිර්ණය කරන ලදී.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය තුළ හඳුනා ගත් වගකීම 2020.12.31 දිනට ඇති බැඳීමේ වර්තමාන වටිනාකම වේ.

1.4 ආදායම හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට හැකි තරමට ආදායම හඳුනා ගැනේ.

2020 වසර සඳහා පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු රජයේ ප්‍රදානය රු. මිලියන 579.3ක් විය.

1.5 වියදම්

වියදම් දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්ය සාධනය තුළ හඳුනා ගනු ලැබේ. ආයතනය පවත්වා ගෙන යාමේ දී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී දැරූ සියලුම විදයම් වසර සඳහා අතිරික්තය/ හිඟය අනුව ආදායමට එකතු කර ඇත.

1.6 සංඝන්දනාත්මක තොරතුරු

හැකි සෑම විටම සෑම ප්‍රකාශයකම සංඝන්දනාත්මක සංඛ්‍යා දක්වා ඇත.

DB/DK

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. HED/F/IIM/FA/01/2020/03

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 සැප්තැම්බර් 01

RECEIVED
01 OCT 2021
Director's Office
IIM, Rajagiriya

Institute of Indigenous Medicine
EXAMINATIONS
04 OCT 2021
University of Colombo

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.ඒ. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :-
1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය
4. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/F/IIM/FA/01/2020/03

මෙහේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 සැප්තැම්බර් 01 දින

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පලමු මුල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වැරදි සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම් රු.20,846,515ක් ඉදිරියට ගෙන ආ සමුච්චිත ලාභ ශේෂයට ගලපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 42 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම්වල සාධාරණ අගයන් ප්‍රත්‍යාගණය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළයුතු වුවද විශ්වවිද්‍යාලය විසින් 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්, තවදුරටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.25,865,542ක් වූ පුස්තකාල පොත්පත් හි සාධාරණ අගය ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 55 ඡේදයෙහි සඳහන් විධිවිධානවලට අනුකූල නොවන පරිදි 2011 හා 2016 වර්ෂයන්හිදී වත්කම් විශ්‍රාම ගැන්වීමකින් හෝ ඉවත් කිරීමකින් තොරව 2019 හා 2020 වර්ෂවලදී එකතුව රු.28,039,464ක මුදලක් ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් පොදු සංචිත ගිණුමට මාරුකර තිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් මාසයේ සිට භාවිතයට ගෙන තිබුණු පිරිවැය රු.15,530,131ක් වූ නව දේශනශාලාව 2020 ජූලි මාසයේ දී ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ ක්ෂය රු.426,530ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය හා ගොඩනැඟිලි වටිනාකම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇනිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශය සියලු තෙරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය	අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.
(ආ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	චක්‍රලේඛයට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(ඇ)	1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක් ඇතුළත එහි ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ විභාග 05 ක හා පෙර වර්ෂයේදී පවත්වා තිබූ විභාග 04 ක ප්‍රතිඵල නිකුත් කිරීම මාස 04 සිට මාස 07 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12- දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයතනය විසින් රු.17,254,537ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණද ආයතනයට අදාළ කර ගත හැකි තිරසාර සංවර්ධන ඉලක්ක හා අරමුණුද, එම ඉලක්ක කරා ළඟා වීමේ සන්ධිස්ථානයන්ද ඉලක්ක ළඟාවීම මැන බැලීම සඳහා හඳුනාගන්නා දර්ශකයන් ද සකස් කර ඒ අනුව ප්‍රගතිය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 24ක සිට ශිෂ්‍ය නේවාසිකාගාරය පවත්වාගෙන යනු ලබන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහිත ඉඩම කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය වෙත පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 අගෝස්තු 28 දින ලැබී තිබුණ ද මෙම ඉඩම පවරා ගැනීමේ කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මගේ අංකය IIM/FS04/AR/2020 දිනය :01.10.2021

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණනාධිපති වාර්තාව

අංක HED/F/IIM/FA/01/2020/03 දරණ 2021/09/02 දිනැති යටෝක්ත විගණකාධිපති වාර්තාවට අදාල පිලිතුරු පහතින් ඉදිරිපත් කර ඇත.

1. මූල්‍ය ප්‍රකාශන

1.2 මතය සඳහා පදනම

(අ). විගණනය විසින් පෙන්වා ඇති රු. 20,846.515 ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 ඡේදයේ සඳහන් පරිදි කටයුතු කල යුතු පෙර වර්ෂයේ වරදක් නොවන අතර පවත්නා ගිණුම් වර්ෂයේ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීමේදී කරන ලද ගැලපුමකි. එනම් පෙර වර්ෂයේ ආයෝජන යටතේ පැවති ස්ථාවර තැන්පතුව නිශ්කාෂණය කර ලබා ගත් මුදලින් අර්ධ ස්ථීර ගොඩනැඟිල්ලක් ඉදි කිරීම සඳහා දරණ ලද වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කරන ලද අතර පවත්නා ගිණුම් වර්ෂයේ අදාළ ගොඩනැඟිල්ල සඳහා වූ අවසන් ගෙවීම් කළ පසු එය ප්‍රාග්ධනිත කරන අවස්ථාවේදී කරන ලද ගැලපීම් වේ.

(ආ). රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 හි 44 ඡේදයේ සඳහන් පරිදි වටිනාකම් තීරණය කිරීමට අපහසු වත්කමක් ලෙස පුස්තකාල පොත් සැල්කිල්ලට ලක් කර ඇත. එබැවින් පුස්තකාල පොත් පත්හි වටිනාකම් තීරණය කිරීම හෝ එලදායී ජීවිත කාලය තීරණය කිරීම් ඉතාමත් අපහසු ප්‍රායෝගික නොවන කාර්යයක් බැවින් 2019 විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබූ පරිදි ඒවා ප්‍රත්‍යාගණනය කිරීමට හෝ ගිණුම් ප්‍රකාශන වල සටහන් මඟින් හෙලිදරව් කිරීමට කටයුතු කල යුතු වන බවට සහ කරුණට අදාළව 2020 ගිණුම් වර්ෂය තුළ සම්පූර්ණ වශයෙන් ක්ෂය වී ඇති පුස්තකාල පොත් වටිනාකම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් මඟින් හෙලිදරව් කිරීමට කටයුතු කර ඇත. මීට අමතරව අනෙකුත් විශ්වවිද්‍යාල වල හා වෙනත් ප්‍රධාන පුස්තකාලයන්හි මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය සලකා බලා විධිමත් ක්‍රමයක් පවතින්නේ නම් එය අධ්‍යයනය කර ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ඇ). ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 හි 55 ඡේදය පහත පරිදි වේ.

දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීමෙන් ඉවත් කළ විට ශුද්ධ වත්කම් / ස්කන්ධය තුළ ඇතුළත්ව ඇති ප්‍රත්‍යාගණන අතිරික්තය මුළුමනින්ම හෝ කොටසක් සෘජුවම සමුච්චිත

අතිරික්තයට හෝ ඌනතාවයන්ට මාරු කළ හැකිය. මෙයට දේපළ පිරියත හා උපකරණ පන්තියේ අතිරික්තයම අදාළ වන වත්කම් විශ්‍රාම ගැන්වීම හෝ ඉවත් කිරීමේදී මුළු අතිරික්තයම හෝ කොටසක් මාරු කිරීම ඇතුළත් විය හැක. **"කෙසේ වුවද අතිරික්තයෙන් යම් ප්‍රමාණයක් අස්ථීත්වය විසින් වත්කම භාවිතා කිරීමේදී ද මාරු කළ හැකිය. එවැනි අවස්ථාවක මාරු කරනු ලැබූ අතිරික්තයේ ප්‍රමාණය වනුයේ වත්කමෙහි ප්‍රත්‍යාගණිත ධාරණ අගයම පදනම් වූ ක්ෂය සහ වත්කමෙහි මුල් පිරිවැයම පදනම් වූ ක්ෂය අතර වෙනස වේ."** ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් සමුච්චිත අතිරික්තයට/ඌනතාවයන්ට මාරු කිරීම අතිරික්තයක් හෝ ඌනතා ප්‍රකාශනය හරහා සිදු කරනු නොලැබේ.

ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 07 හි 55 ඡේදයේ සඳහන් විධිවිධාන අනුව නිවැරදිව ගිණුම්ගතව ඇත.

(ඇ). ආයතනය විසින් ඉදිකර තිබූ අර්ධ ස්ථර ගොඩනැගිල්ලේ වටිනාකම රු. 15,308,853 කි. අදාළ ගොඩනැඟිල්ලේ අවසන් ගෙවීම කළ දින එනම් 2020/07/17 දින සිට ක්ෂය කිරීම් සිදු කර ඇත. ඒ අනුව වර්ෂය සඳහා අදාළ ක්ෂය ප්‍රමාණය වනුයේ රු. 349,976/52 කි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

(අ). ආයතනය විසින් අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් තනතුරක් ඇති කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබුවත් ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත. තවද ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨයක් බවට පත් කිරීමට කටයුතු කරමින් සිටින බැවින් අභ්‍යන්තර විගණන අංශයක අවශ්‍යතාවය පිළිබඳව සලකා බැලිය යුතුය.

(ආ) අප ආයතනය විසින් සකස් කළ 2020 ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය 2020.02.03 වන දින පැවති 461 වැනි කළමණාකරණ මණ්ඩලය විසින් ලබා දී ඇති අතර එහිදි 2020 ට අදාළ පහත ලේඛන සඳහා අනුමැතිය ලැබී ඇත .

I. ක්‍රියාකාරී සැලැස්ම - 2020
II. 2020 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා අතුරු ගිණුම්
III. ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම - 2020

2020.07.27 වන දින කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත්තේ කෝවිඩ් - 19 වෛරසය නිසා ඇති වූ තත්වය මත ආයතනය 2020 මාර්තු මස සිට මැයි මස දක්වා වසා තැබීමට සිදු වීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා සකස් කළ අපගේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සඳහායි.

ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම 2020 වර්ෂයට අදාළව යාවත්කාලීන කර සකස් කර ඇත.
අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම ආදී සැලසුම් වල එකතුවකින් දිගු කාලීන දැක්මක් සහිතව අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් අප ආයතනය විසින් සකසනු ලබන්නේ උපාය මාර්ගික සැලැස්මකි. එලෙස උපාය මාර්ගික

සැලැස්මක් 2020-2024 කාලය සඳහා අප විසින් සකස් කර කළමණාකරකාර මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

(ඇ). 2020 වර්ෂයට අදාළව අධ්‍යයන වර්ෂ 05 ට අදාළව විභාග 16 ක් පවත්වා තිබේ. 2020 මාර්තු මස සිට මැයි මස දක්වා කෝවිඩ් වසංගතය හේතුවෙන් ආයතනය වසා තිබූ බැවින් ඉහත සඳහන් කල පරිදි අදාළ විභාග 05 ක ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රමාද විය. තවද 2020 මාර්තු මස ආරම්භ කළ විභාගයෙහි ඉතිරි කොටස පැවැත්වූයේ මැයි මස ආයතනය විවෘත කිරීමෙන් පසුවය. ඉදිරියේදී නියමිත පරිදි මාස 03 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ). 2020 වර්ෂය තුළ ස්ථාවර තැන්පතු ආරම්භ කර ඇත්තේ රු. 6,037,635 ක් පමණි. ඒ සඳහා මුදල් කමිටුවේ සහ කළමණාකාර මණ්ඩලයේ නිර්දේශය හා අනුමැතිය ලබා ගෙන ඇත. තවද අදාළ මුදල් තාවකාලික අතිරික්ත මුදල් නොවන බවද පෙන්වා දිය හැක. කෙසේ වෙතත් ඉදිරියේදී ස්ථාවර තැන්පතු ආර්මභ කිරීමේදී මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

2.3 වෙනත් කරුණු

(අ). තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ අරමුණින් යුතුව ආයතනය තුල හරිත තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා හරිත තාක්ෂණ ව්‍යාපෘති යෝජනාවලියක් සකස් කරන ලද අතර එම ව්‍යාපෘති යෝජනාවලිය සඳහා ගොඩනැගිලි කමිටුවේ නිර්දේශය සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියද හිමිව ඇත. තවද ආයතනය විසින් අදාළ ව්‍යාපෘති යෝජනාවලිය ක්‍රියාවට නැංවීම ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතිය පහත පරිදි සංෂිප්ත කර දක්වනු ලැබේ.

1) ප්‍රතිචක්‍රීකරණය

මේ යටතේ ආයතනික පරිශ්‍රය තුළ කොම්පෝස්ට් බඳුන් ස්ථාපනය කිරීමට තීරණය කර ඇති අතර බඳුන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

2) වායු පවිත්‍රකරණය

වායු පවිත්‍රකරණය රුකුල් දෙන ශාක සන්නායක් දැනටමත් ආයතනික පරිශ්‍රය තුළ පවතින අතර එම තත්වය අනාගතයේදී පවත්වාගෙන යාමේ අරමුණින් මෙමෙ වර්ෂයේදී ද රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

3) කසල කලමකරණය

කසල කළමනාකරණය ක්‍රමවත් කිරීමේ අරමුණින් කසල වර්ගීකරණයට අදාළ සම්මත වර්ණයන්ගෙන් යුතු කසල බඳුන් ආයතන පරිශ්‍රයේ සුදුසු ස්ථාන වල ස්ථානගත කිරීමට තීරණය කරන ලද අතර මේ සඳහා අවශ්‍ය සම්මත බඳුන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

4) බලශක්ති සංරක්ෂණය

බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආයතනයේ පරිපාලන ගොඩනැගිල්ලේ වහලය මත solar panel පද්ධතියක් සවි කිරීමට තීරණය කරන ලද අතර මීට අදාළව පිරිවිතර සකස් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

(ආ). ශිෂ්‍ය නේවාසිකාගාරය පවත්වාගෙන ගිය ඉඩම සඳහා ආයතනය විසින් ඉදිරිපත් කරන ලද නව ගොඩනැඟිලි සැලසුම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලැබී ඇති අතර එම අනුමත සැලසුම් සමඟ සම්පූර්ණ ඉඩම වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට පැවරීමට 2021.05.17 දින කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර යෝජිත වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පැවරුම් ලිපි ලේඛණ ආයතනය වෙත ලැබීමේ බලාපොරොත්තුවෙන් සිටි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඒ. පරණගම,
අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය.